# රණවිරුවා

2023 අගෝස්තු • 258 කලාපය




මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර



# චීන හමුදාවෙන් විශේෂ සන්නිවේදන රථ පෙළක්

චීන හමුදාව වෙතින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත පිරිනමන ලද විශේෂ සන්නිවේදන රථ 11 ක් වැඩබලන ආරක්ෂක අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) වෙත යුද්ධ හමුදා මූලස්ථානයේදී ඉකුත් අගෝස්තු මස 22 වන දින භාරදෙන ලදී. මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ සහ ශ්‍රී ලංකාවේ මහජන චීන සමූහාණ්ඩුවේ තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක ජ්‍යෙෂ්ඨ කර්නල් ෂෝව් බෝ (Senior Colonel Zhou Bo) ද එක් වූහ.



මෙරට ත්‍රිවිධ හමුදාවට වැදගත් වන ක්ෂේත්‍ර සන්නිවේදන රථ දහයක් සහ ජංගම අණදීම් සහ පාලන රථයක් සංකේතාත්මකව එහිදී ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා වෙත ජ්‍යෙෂ්ඨ කර්නල් ෂෝව් බෝ විසින් භාරදෙන ලදී.





# ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව සෙන්පති ඇතුළු විරුවන් සිහිපත් කෙරේ



වර්ෂ 1992 අගෝස්තු 8 වන දින යාපනයේ අරාලි තුඩුවේදී එල්ටීටීඊ ත්‍රස්තවාදීන් ඇටවූ බිම්බෝම්බයකට ගොදුරු වීමෙන් මව්බිම වෙනුවෙන් සිය ජීවිත පූජාකළ ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව, මේජර් ජෙනරාල් විජය විමලරත්න ඇතුළු රණවිරුවන්ගේ "31 වන ගුණ සමරුම" නිමිත්තෙන් සංවිධානය කරන ලද දේව මෙහෙයක් තිඹිරිගස්යාය ශාන්ත තෙරේසා දේවස්ථානයේදී ඉකුත් අගෝස්තු 03 වන දින පැවැත්විණි.

ලලී කොබ්බෑකඩුව මහත්මියගේ සහභාගීත්වයෙන් පැවති මෙම දේව මෙහෙය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුළු ත්‍රිවිධ හමුදා නිලධාරීවරුද අභාවප්‍රාප්ත එම නිලධාරීන්ගේ පවුලේ සාමාජිකයින් රැසක්ද එක්ව සිටියහ.





# දීඝවාපිය පුදබිමේ තැන්පත් කිරීමට නියමිත සර්වඥ ධාතු සහ චූඩා මාණික්‍යය ප්‍රදර්ශනයට











ප්‍රතිසංස්කරණය කරනු ලැබූ දීඝවාපිය චෛත්‍යයේ තැන්පත් කිරීමට නියමිත සර්වඥ ධාතු සහ චූඩා මාණික්‍යය දීපව්‍යාප්ත ජංගම ප්‍රදර්ශනය කිරීමේ පුණ්‍ය වැඩසටහනේ ආරම්භය සනිටුහන් කරමින් පසුගිය අගෝස්තු මස 29 වන දින සන්ධ්‍යාවේ කැලණිය රජමහා විහාරස්ථානයේදී එම ධාතු ප්‍රදර්ශනය ආරම්භ කෙරිණි.

මෙම පුණ්‍ය අවස්ථාව සඳහා ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, යුද්ධ හමුදාධිපති, නාවික හමුදාධිපති සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ද සහභාගී වූහ.

පෞරාණික දීඝවාපිය චෛත්‍යය ප්‍රතිසංස්කරණය කිරීම ආරක්ෂක අමාත්‍යාංශයේ සහ අදාළ බලධාරීන්ගේ උපදෙස් මත යුද්ධ, නාවික, ගුවන්, පොලිස් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වය මත සිදුකෙරිණි.





# එක්සත් ජනපද හමුදාවේ '8th Theater Sustainment Command' හි නියෝජිත පිරිසක් යුද්ධ හමුදාධිපති හමුවෙති

එක්සත් ජනපද හමුදාවේ මේජර් ජෙනරාල් ජෙරාඩ් හෙල්විග්ගේ (Major General Jerad Helwig) නායකත්වයෙන් යුත් එක්සත් ජනපද හමුදාවේ '8th Theater Sustainment Command' හි නියෝජිත පිරිසක් ඉකුත් අගෝස්තු මස 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ. එම පිරිසට 130 ඉංජිනේරු බලසේනාධිපති කර්නල් මැක්(ගු)නෙගල් (Colonel McGunegle), කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී ලුතිනන් කර්නල් ඇන්තනි නෙල්සන් (Lieutenant Colonel Anthony Nelson) සහ විධායක නිලධාරී මේජර් තෙරේසා (Major Theresa) යන අයද ඇතුළත් වූහ.

නියෝජිත කණ්ඩායමේ ප්‍රධානියා ප්‍රථමයෙන් එම හමුවේදී එක්සත් ජනපද හමුදාවේ '8th Theater Sustainment Command' සහ එහි ප්‍රමුඛතා පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරමින් ඊට අනුබද්ධිතව ක්‍රියාත්මක කෙරෙන මෙහෙයුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා බහුජාතික තිරසාර විසඳුම් ලබාදීම සහ විවිධ මෙහෙයුම් සඳහා උපාය මාර්ගික සැලසුම් පිළිබඳ සාකච්ඡා කරන ලදී. මෙම හමුවේදී යුද්ධ හමුදාධිපති යුද්ධ හමුදාවේ හවුකාර්ය සම්පාදන කාර්යභාරය සහ එය ඉටුකිරීමට ඇති හැකියාවන් පිළිබඳව මෙන්ම වත්මන් සැපයුම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සාකච්ඡා කෙරිණ. තවද, එහිදී විශේෂ මෙහෙයුම් ක්‍රියාත්මක කරන අවස්ථාවන්හිදී ඇමෙරිකා එක්සත් ජනපද හමුදාව සහ අනෙකුත් හමුදාවන් සමග හවුකාර්ය සම්පාදන ක්‍රියාවලිය සිදුකරන ආකාරය පිළිබඳව ද අදහස් හුවමාරු කරගන්නා ලදී.


## ඉරාන ඉස්ලාමීය ජනරජයේ මෙරට තානාපති කාර්යාලයේ හමුදා නියෝජිත යුද්ධ හමුදාධිපති හමුවෙයි

ඉරාන ඉස්ලාමීය ජනරජයේ කොළඹ තානාපති කාර්යාලයේ හමුදා නියෝජිත කර්නල් හොමවුන් අලි යාරි (Colonel Homaoun Ali Yari) පසුගිය අගෝස්තු මස 15 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති හමුවිය.

ඔවුහු මෙම හමුවේදී ද්විපාර්ශ්විකව වැදගත්වන ආරක්ෂක කටයුතු යනාදී කරුණු පිළිබඳ අවධානය යොමුකරමින් අදහස් හුවමාරු කර ගත්හ.



# ඉන්දියානු ජාතික ආරක්ෂක විද්‍යාල දූත පිරිස යුද්ධ හමුදාධිපති හමුවෙති





උපායමාර්ගික, සංකල්ප සහ පරිවර්තන රියර් අද්මිරාල් සංජය සච්දේවා (Rear Admiral Sanjaya Sachdeva) ප්‍රමුඛ සාමාජිකයන් නවදෙනකුගෙන් සමන්විත ඉන්දියානු ජාතික ආරක්ෂක විද්‍යාල දූත පිරිසක් මෙරට පස්දින අධ්‍යයන චාරිකාවක නිරතවෙමින් ඉකුත් අගෝස්තු 28 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පි එන්ඩියූ හමුවූහ.

එහිදී, යුද්ධ හමුදාධිපති එම පිරිස සමඟ අදහස් හුවමාරු කරගත් අතර දෙරටෙහි හමුදා සාමාජිකයන් සමඟින් සිය අත්දැකීම් පිළිබඳව ද කරුණු සාකච්ඡා කරනු ලැබීය. රියර් අද්මිරාල් සංජය සච්දේවා එන්එම් එස්ඩීඑස් (නාවික හමුදා) එන්ඩීසී සහ යුද්ධ හමුදාධිපති මීට වසර කිහිපයකට ප්‍රථම ඉන්දුනීසියාවේදී පැවති ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පාඨමාලාවේ සමකාලීනයන් වීමද විශේෂත්වයකි.

# හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් දයා රත්නායක (විශ්‍රාමික) යුද්ධ හමුදාධිපති හමුවෙයි





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 20 වන යුද්ධ හමුදාධිපති ජෙනරාල් ආර්එම් දයා රත්නායක (විශ්‍රාමික) පසුගිය අගෝස්තු මස 28 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පි එන්ඩියූ හමුවිය.

මෙම සුහද හමුවේදී, හිටපු යුද්ධ හමුදාධිපති වසර 35 කට අධික සේවා කාලය තුළ විවිධ තනතුරු හොබවමින් යුද්ධ හමුදාව සහ මව්බිමේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකළ සේවය මෙන්ම නැගෙනහිර මානුෂීය මෙහෙයුමේ නිරතව සිටියදී සිදුකළ නිර්භීත කාර්යභාරය ද යුද්ධ හමුදාධිපතිතුමන් සිහිපත් කළේය. සුහද හමුව අවසන යුද්ධ හමුදාධිපති විසින් ජෙනරාල් ආර්එම් දයා රත්නායක (විශ්‍රාමික) වෙත සමරු තිළිණයක් ද ප්‍රදානය කළේය.







# ශ්‍රී දළඳා මාලිගාවේ වාර්ෂික ඇසළ පෙරහැර ආලෝකමත් කිරීමට යුද්ධ හමුදාවෙන් "කොප්පරා" පූජාව මෙවරත්



ඉපැරණි සම්ප්‍රදායන්ට අනුව මහනුවර ශ්‍රී දළදා මාලිගාව මගින් වාර්ෂිකව පවත්වන "ඇසළ පෙරහැර මංගල්‍යය" වීදි සංචාරය කරන මාර්ග ආලෝකමත් කිරීම සඳහා ශ්‍රී දළදා මාලිගාව වෙත යුද්ධ හමුදාව විසින් අඛණ්ඩව 10 වන වරටත් කොප්පරා පොත් 20 ක් පූජාකරන ලදි. යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් පසුගිය අගෝස්තු මස 11 වන දින එම කොප්පරා තොගය දියවඩන නිලමේ තුමන් වෙත පිළිගන්වනු ලැබිය. කුරුණෑගල, බෝයගනේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා විජයබාහු පාබල රෙජිමේන්තුවේ හටපිරිස් විසින් පුරාණ ආගමික චාරිත්‍රවලට සහ පැරණි සම්ප්‍රදායන්ට අනුකූලව සෑම වසරක් පාසාම ඇසළ පෙරහැර වෙනුවෙන් මෙම කොප්පරා පූජාව සිදුකරනු ලබයි. ඒ අනුව දළදා පෙරහැර ආලෝකමත් කිරීම සඳහා එමගින් පෙරහැරේ පන්දම්කරුවන් වෙත නොකඩවා කොප්පරා සැපයේ.

විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී විසින් කරන ලද ආරාධනයකට අනුව එම අවස්ථාවට සපැමිණි යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මියගේ සහභාගීත්වයෙන් සම්ප්‍රදායික තේවා චාරිත්‍රවලින් අනතුරුව, කොප්පරා බහාලුමක් ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල බණ්ඩාර මහතා වෙත සංකේතාත්මකව පිරිනැමීය.




# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු

# රගර් ශූරතාව

යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු රගර් ශූරතාවලිය - 2023, අවසන් තරගය පසුගිය අගෝස්තු මස 04 වන දින පනාගොඩ යුද්ධ හමුදා රගර් ක්‍රීඩාංගනයේදී අති උත්කර්ෂවත් අයුරින් පැවැත්විණ. එය නැරඹීම සඳහා යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන් ඇතුළු රගර් ක්‍රීඩා ලෝලීහු රැසක් සහභාගී වූ අතර, එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. අන්තර් රෙජිමේන්තු රගර් ශූරතා තරගාවලිය (කාන්තා) -2023 අවසන් මහා තරගයද එදින පනාගොඩ යුද්ධ හමුදා රගර් ක්‍රීඩාංගනයේදී පැවැත්විණි.

මෙම තරගාවලියේ පිරිමි අංශයේ අවසන් තරගය ශ්‍රී ලංකා සංඥා බලකා රගර් කණ්ඩායම සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා රගර් කණ්ඩායම අතර පැවති අතර, එහිදී, ලකුණු 19 - 17 ක් ලබා ගනිමින් ශ්‍රී ලංකා සංඥා බලකා රගර් කණ්ඩායම ශූරතාවය හිමිකර ගත්හ. එදින එම ක්‍රීඩාංගණයේදී "අන්තර් රෙජිමේන්තු කාන්තා රගර් ශූරතාවලිය 2023" ද පැවති අතර එහිදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා කණ්ඩායමේ ක්‍රීඩිකාවන් ලකුණු 17 - 05 ක් ලෙස යුද්ධ හමුදා කාන්තා බලකායේ ක්‍රීඩිකාවන් පරදා එහි ශූරතාවය හිමිකර ගැනීමට සමත්වූහ.

අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා රගර් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් එම්ජ්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා රගර් කමිටුව ලබාදුන් උපදේශයන්ට අනුව යුද්ධ හමුදාවේ රෙජිමේන්තු දහසයක පිරිමි රගර් කණ්ඩායම් සහ රෙජිමේන්තු පහක කාන්තා රගර් කණ්ඩායම් මෙවර තරගාවලියට එක්වූ අතර, එය 2023 ජූනි මස 09 වන දින ආරම්භ විය.



උණුසුම් තරගයකින් පසුව ජයග්‍රාහී සංඥා බලකා සහ පොදු සේවා බලකා කණ්ඩායම් සඳහා අත්පොළසන් හඬ මධ්‍යයේ ශුරතා කුසලානයන් පිරිනැමීම යුද්ධ හමුදාධිපති අතින් සිදුවිය.

රගර් තරගාවලියේදී දක්ෂතම ක්‍රීඩකයා වශයෙන් ශ්‍රී ලංකා සංඥා බලකායේ ලාන්ස් කෝප්‍රල් ජයවික්‍රම ඩීජීසීඑල් සහ දක්ෂතම ක්‍රීඩිකාව ලෙස යුද්ධ හමුදා පොදු සේවා බලකායේ කාන්තා සෙබළ කහඳව කේජීඑන් සම්මාන ලැබූහ.

පසුගියදා තායිලන්තයේ පැවති ආසියානු මලල ක්‍රීඩා ශුරතාවලිය, පැරිසියේ පැවති පැරා මලල ක්‍රීඩා ලෝක ශුරතාවලිය සහ ඉන්දියාවේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ සහ යොවුන් ක්‍රීඩා ශුරතාවලියේදී දස්කම් දැක්වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිරිගැන්වීම සඳහා මූල්‍යමය ත්‍යාග ප්‍රදානය කිරීමද යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් මෙහිදී සිදුවිය.















# යුද්ධ හමුදාධිපති මින්නේරිය පාබල පුහුණු පාසලේ සංචාරයක

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ඉකුත් අගෝස්තු 25 වන දින පස්වරුවේ මින්නේරිය පාබල පුහුණු මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර සංචාරයක නිරතවිය. එහිදී, එම පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්එස්කේ ලියනවඩුගේ ආර්එස්පී විසින් එහි සිදුකරනු ලබන පුහුණුවීම් පිළිබඳ විස්තරයක්ද යුද්ධ හමුදාධිපති වෙත ඉදිරිපත් කළේය.

අනතුරුව එම පුහුණු පාසලේ නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ අවි පුහුණුවීම් පරීක්ෂාවට ලක්කළ යුද්ධ හමුදාධිපති එහි සිසුන්ගේ භාවිතය සඳහා නවතමයෙන් ස්ථාපිත කරනු ලැබූ *RPG - 7* සුළු අවි විඩම්භකය *(Simulate)* විවෘත කිරීමටද එක්විය. එහිදී, ගෙතෙම *RPG - 7* සුළු අවි විඩම්භක සහ මෝටර් සුළු අවි විඩම්භක වෙඩි තැබීමේ අවස්ථාවන්ද නැරඹුවේය. තවද, එම පුහුණු පාසලේ කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනයට තබා ඇති බලඇණි සහ බණ්ඩ ආධාරක අවි නිරීක්ෂණය කළ එතුමන් එහිදී පාඨමාලාවේ නිරත භටපිරිස් සමඟ සුහද පිළිසඳරක ද නිරතවූහ. මෙම අවස්ථාවට අධ්‍යක්ෂ ජෙනරාල් පාබල හමුදා, අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික, ආරක්ෂක සේනා ආඥාපති (නැගෙනහිර), ආඥාපති - ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක්ද සහභාගී වූහ.







# යුද්ධ හමුදාධිපති මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ සංචාරයක









යුද්ධ හමුදාධිපති ඉකුත් අගෝස්තු 25 වන දින මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ සංචාරයක නිරත වූ අතර, එහිදී ඔවුන්ගේ පුහුණුවීම් කටයුතුවල ප්‍රගතිය සහ ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳව සොයාබැලීය.

එම පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඒබීජේඑන් ආරියතිලක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් යුද්ධ හමුදාධිපති උණුසුම් අයුරින් පිළිගනු ලැබූ අතර, එහිදී එම පුහුණු පාසලේ අණදෙන නිලධාරී කර්නල් එම්ටීඅයි ගුණවර්ධන ආර්එස්පී පීඑස්සී විසින් *Wisdom Hall* පරිශ්‍රයේදී පුහුණු පාසලේ සිදුකරනු ලබන පුහුණුවීම් කටයුතු පිළිබඳ යුද්ධ හමුදාධිපති දැනුවත් කිරීමටද කටයුතු කරන ලදී.

පුහුණු පාසලේ දැනට පවතින යටිතල පහසුකම් සහ ඉදිවෙමින් පවතින නව ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතු ද යුද්ධ හමුදාධිපති නිරීක්ෂණය කළ අතර, එහිදී එම ව්‍යාපෘතියේ ඉදිකිරීම්භාර අයවළුන් සමඟ එහි කටයුතු සම්බන්ධයෙන් අදහස් හුවමාරුවකද නිරත වූහ. තවද, එම කඳවුරු පරිශ්‍රයේ නවතමයෙන් ඉදිකරන ලද බැඩ්මින්ටන් ක්‍රීඩා පිටිය විවෘත කිරීමටද යුද්ධ හමුදාධිපති එක්විය.





# මහනුවර යුද්ධ හමුදා මූලික රෝහලේ සංචාරයක





අභිනවයෙන් ස්ථාපිත කරනු ලැබූ පල්ලේකැලේ යුද්ධ හමුදා රෝහලේ ක්‍රියාකාරී අංශයන්හි කටයුතු පරීක්ෂා කිරීමේ අරමුණින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය අගෝස්තු 11 වන දින එහි සංචාරයක නිරතවිය. රෝහල් කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂකගේ ගෞරවනීය පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපති එම රෝහල් කටයුතු නිසි ආකාරයෙන් පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ සාකච්ඡාවකද නිරත විය.

එහිදී, රෝහල තුළ ක්‍රියාත්මක වන බාහිර රෝගී අංශය නිරීක්ෂණය කළ යුද්ධ හමුදාධිපති රාජකාරීන්හි නියුතු වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සහ සුළු සේවක කාර්ය මණ්ඩලය සමඟ සුහද අදහස් හුවමාරුවක ද නිරත විය.

මෙම සංචාරය සඳහා යුද්ධ හමුදා උපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී, මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී, යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් පීඒසී ප්‍රනාන්දු යූඑස්පී ඇතුළු නිලධාරීහු සහභාගී වූහ.

# යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂක මණ්ඩලයේ 'e-Portal Widget' මෘදුකාංගය එළිදක්වයි











යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂක මණ්ඩලය මඟින් පසුගිය අගෝස්තු මස 23 වන දින යුද්ධ හමුදා සාමාජිකයින්ට "සුවසහන අරමුදල", ණය පහසුකම් ආදිය සඳහා වූ තොරතුරු දැනගැනීමට 'e-Portal Widget' මෘදුකාංගය එළිදැක්වීම සහ යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු හමුදා සාමාජිකයින්ගේ පාසල් අධ්‍යාපනය ලබන ළමුන්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට අත්‍යාවශ්‍ය වියළි ආහාර ද්‍රව්‍ය, ඇස් කන්නාඩි සහ පාසල් පාවහන් බෙදාදීමේ වැඩසටහනක් පවත්වන ලදී.

සුබසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්පීඑ්ආර්පී රාජපක්ෂ ආර්එස්පී ගේ ආරාධනයෙන් මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති සහභාගී විය.

යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ශ්‍රී ලංකා සංඥා බලකායේ ප්‍රධාන සංඥා නිලධාරී සහ බලකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ ගේ සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් තොරතුරු තාක්ෂණ කර්නල් එම්ආර් හම්ම් යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ තාක්ෂණික නිලධාරීන් විසින් 'e-Portal Widget' මෘදුකාංගය නිර්මාණය කරන ලදී. මෙමඟින් යුද්ධ හමුදා සාමාජිකයින්ට සුවසහන අරමුදල, ණය පහසුකම්, වෙනත් සුබසාධන ප්‍රතිලාභ පිළිබඳව වූ තොරතුරු ලබාගැනීමට හැකි වේ.

එහිදී, යුද්ධ හමුදා සාමාජිකයන්ගේ පවුල්වල තෝරාගත් ළඟම ඥාතීන් 25 දෙනකු සඳහා සංකේතාත්මකව ඇස් කන්නාඩි බෙදාදීමද, රුපියල් 7500.00 වටිනාකමකින් යුත් වියළි ආහාර සලාක ඇසුරුම් 25 සහ "බාටා" පුද්ගලික සමාගම වෙතින් රුපියල් 1000.00 වටිනාකමකින් යුත් තෑගි වවුචර් 25 ක්ද ප්‍රදානය කරන ලදී.

තවද, යුද හමුදා සාමාජිකයන්ගේ පවුල්වල අධ්‍යාපනය ලබන 2022 වසරේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් පාසල් ළමුන් 25 දෙනකු වෙත එහිදී රුපියල් 7500.00 වටිනාකමකින් යුත් පාසල් උපකරණ අඩංගු පාර්සල් සහ පාසල් පාවහන් බෙදාදීමද සිදුකෙරිණ. ඇස් කන්නාඩි සඳහා අනුග්‍රාහකත්වය "පුෂ්පකුමාර පදනම" මඟින්ද පාසල් පාවහන් හා තෑගි වවුචර් සඳහා අනුග්‍රාහකත්වය "බාටා" පුද්ගලික සමාගම මඟින්ද ලබාදුන් අතර, අනෙකුත් ද්‍රව්‍ය සඳහා අනුග්‍රාහකත්වය ලබාගැනීමේ කටයුතු යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත සුබසාධක අධ්‍යක්ෂක මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් සිදුකරනු ලැබිය.



# විරු දිරියට අත්වැලක්...




යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් ක්‍රියාත්මක කරනු ලබන සුබසාධක ව්‍යාපෘතීන් තවදුරටත් පුළුල් කරමින් යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු සාමාජිකයන් පිරිසක් වෙත වියළි ආහාර සලාක පාර්සල් 100 ක් බෙදාදීමේ වැඩසටහනක් පසුගිය අගෝස්තු මස 04 වන දින ක්‍රියාත්මක කෙරිණි. එම අවස්ථාව සඳහා සම්භාවනීය අමුත්තන් ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූහ.

මෙම වැඩසටහනට සමගාමීව, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය වෙතින් ක්‍රියාත්මක කරනු ලබන රණවිරු යෝගට් නිෂ්පාදන ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා එම සේවා වනිතා ශාඛාව වෙත අධිශීතකරණ 3 ක් පරිත්‍යාග කිරීමද සිදුවිය. තවද, රණක්මිතයට පත් ගජබා රෙජිමේන්තුවේ රණවිරුවකුගේ අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවසේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා රුපියල් ලක්ෂ 6 ක මූල්‍ය පරිත්‍යාගයක් ද එහිදී සිදුකරනු ලැබිය.





# යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ
# නව වෙබ් අඩවිය
# එළිදැක්වේ



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ නව වෙබ් අඩවිය ඉකුත් අගෝස්තු මස 04 වන දින එළිදැක්වීම යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ සහභාගීත්වයෙන් සිදුකෙරිණ.

යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනියගේ ඉල්ලීම පරිදි, යුද්ධ හමුදා ජනමාධ්‍ය අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ මඟපෙන්වීමෙන් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී හා කර්නල් ජනමාධ්‍ය කර්නල් ඒඑම්ඩීබී අධිකාරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ මෙම කටයුත්ත සිදුවිය. තවද, මූල්‍ය පිරිවැයකින් තොරව යුද්ධ හමුදා මෘදුකාංග ශිල්පීන්ගේ සහ තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහාය ඇතිව මෙම නව වෙබ් අඩවිය නිර්මාණය කරන ලදී. මෙමගින් එම ඒකකයේ සුබසාධන ව්‍යාපෘති, "විරු කැකුළු" ක්‍රියාකාරකම් ඇතුළු සියලු සේවා වනිතා වැඩසටහන් පිළිබඳ තොරතුරු දැනගැනීමේ හැකියාව පවතී.

# යුද්ධ හමුදාධිපති
# මහරගම අපේක්ෂා රෝහලේ
# සංචාරයක

යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ඉකුත් අගෝස්තු 14 වන දින මහරගම අපේක්ෂා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් සොයාබැලීමේ අරමුණින් සංචාරයක නිරතවූහ.

එහිදී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් එම රෝහලේ ප්‍රයෝජනය සඳහා අත්‍යවශ්‍ය ඖෂධ තොගයක් පරිත්‍යාග කිරීමටද රෝහලේ ප්‍රතිකාර ලබන 800 ක පමණ රෝගීන් වෙනුවෙන් පෝෂ්‍යදායී දිවා භෝජන සංග්‍රහයක් ලබාදීමටද කටයුතු යෙදිණ.



# "ප්‍රයිම් මූවර් ක්‍රියාකරුවන්හට" "විනයගරුක" පුහුණුවක් ලබාදීම සඳහා යුද්ධ හමුදාවේ සහය



ශ්‍රී ලංකා ජාතික ආධුනික සහ කාර්මික පුහුණු අධිකාරිය වෙතින් බර වාහන, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ක්‍රියාකිරීම පිළිබඳ පුහුණුව ලබාගැනීමට උනන්දුවක් දක්වන තරුණ තරුණියන් වෙනුවෙන් විදේශ රැකියා අවස්ථා උදාකරදීමේ අරමුණින් ජාතික නිපුණතා මට්ටම (NVQ) 4, "ප්‍රයිම් මූවර් ක්‍රියාකරු" පාඨමාලාවක් පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී. පාඨමාලාවට යුද්ධ හමුදා සාමාජිකයන් යොමුකිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ ජාතික ආධුනික සහ කාර්මික පුහුණු අධිකාරියෙහි සභාපති ඩබ්ලිව් රුචිර අමරසේකර මහතා ප්‍රමුඛ එම අධිකාරියෙහි නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පසුගිය අගෝස්තු මස 14 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී සාකච්ඡාවක් පැවැත්විණි.

ජාතික ආධුනික සහ කාර්මික පුහුණු අධිකාරියේ මූලිකත්වයෙන් ජාතික නිපුණතා මට්ටම (NVQ) 4 සහතිකය සහිත "ප්‍රයිම් මූවර් ක්‍රියාකරු පාඨමාලාව" සිසුන් 40 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට නියමිත අතර, පාඨමාලාවේ අවසන් අදියර යුද්ධ හමුදා උපදේශකවරුන්ගේ සහයෝගය ඇතිව අනුරාධපුර, තිසාවැව ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා පුහුණු පාසලේදී දින 47 ක් පුරාවට පැවැත්වීම සඳහා යුද්ධ හමුදාවේ සහයෝගය ලබාගැනීම පිළිබඳව ද මෙහිදී වැඩිදුරටත් සාකච්ඡා කෙරිණි.

යුද්ධ හමුදාවේ සහයෝගය මත බර වාහන, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ක්‍රියාකිරීම පිළිබඳ නිපුණතා මට්ටමේ පුහුණුවක් සහිත විනයගරුක රියදුරන් බිහිකළ හැකි බවත් මෙවැනි පුහුණු පාඨමාලාවන් තුළින් රටට අවැසි විදේශ විනිමය උපයාගත හැකිවන විදේශ වෙළඳපළ රැකියා අවස්ථා රැසක් උදාවන බවත් මෙම සාකච්ඡාවේදී ජාතික ආධුනික සහ කාර්මික පුහුණු අධිකාරියේ නිලධාරීන් විසින් පෙන්වා දෙනු ලැබිය.

# විරු දිවියට සවියක්





යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් 100 දෙනකු සඳහා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු 15 වන දින යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. පවතින ආර්ථික අපහසුතාවයන් සඳහා සහනයක් ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කරන ලද අතර, මෙහිදී යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ රාජකාරී නියුතු සෙ/ඕ100095 කෝප්‍රල් ගුණසේකර එච්ඒටීකේ යන කොනොනිගේ දියණියගේ අධ්‍යාපන කටයුතු සඳහා "ටැබ්" පරිගණක යන්ත්‍රයක් පිරිනැමීමද සිදුවිය.

# ත්‍රිවිධ හමුදාවේ නීති නිලධාරීන් සඳහා නීතිය පිළිබඳ හරවත් දේශනයක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සංවිධායකත්වයෙන් ත්‍රිවිධ හමුදාවේ රාජකාරියෙහි නියුතු නීති නිලධාරීන් වෙනුවෙන් 'Duty and Responsibility of Law Enforcement within the Scope of the Armed Forces Law Officers' යන මාතෘකාව යටතේ හරවත් දේශනයක් පසුගිය අගෝස්තු මස 18 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ.



යුද්ධ හමුදාවේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල් නීති සේවා සහ විනිසුරු අධිනීතිඥ මේජර් ජෙනරාල් එම්ඒඑම් පීරිස් (විශ්‍රාමික) යූඑස්පී විසින් පැවැත්වූ එම දේශනයට නීතිය ක්‍රියාත්මක කිරීම, සෙබළුන්ගේ විනය ක්‍රියාමාර්ග පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් විය.

යුද්ධ හමුදා නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ කර්නල් එන්එස් නල්ලප්පෙරුම යූඑස්පී එන්ඩීසී ගේ සම්බන්ධීකරණයෙන් පැවැත්වූ මෙම දේශනය සඳහා යුද්ධ හමුදාධිපති ද සහභාගීවීම විශේෂත්වයකි. ත්‍රිවිධ හමුදාවේ නීති නිලධාරීන් 85 කට වැඩි පිරිසක් එක් වූ මෙම දේශනය අතරතුර ඔවුන්ට පැනනැගුණු ගැටළු නිරාකරණය කර ගැනීමටද අවස්ථාව හිමිවිය.

# යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයෙන් පරිත්‍යාගයක්





යුද්ධ හමුදාධිපති තුමන්ගේ මාර්ගෝපදේශකත්වයෙන්, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ උපදෙස් පරිදි කෘතිම පාදයක්, ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍රයක් සහ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු 28 වන දින යුද්ධ හමුදා සේවා වනිතා කාර්යාලයේදී පැවැත්විණ.

එහිදී මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ වසර 19 ක කාලසීමාවක් සේවය කරනු ලැබූ දියවැඩියා රෝගය හේතුවෙන් වම් පාදයේ දණහිසට පහළින් කපා ඉවත්කරන ලද 11 කම්කරු ඩී ලීලාරත්න සිවිල් සේවක මහතා හට කෘතිම පාදයක් පිරිනැමීමත්, පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී නියුතු එෆ්12627 11 කම්කරු වයිඑම්පීජීඑස් කරුණාසේන සිවිල් සේවක මහතාගේ කැළණිය විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය හදාරනු ලබන දියණියගේ අධ්‍යාපන කටයුතු සඳහා ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම මෙන්ම ත්‍රස්තවාදී ප්‍රහාරයට ලක්ව රෙජිමේන්තු මූලස්ථානය බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුව වෙත ඇතුළත් කිරීමෙන් අනතුරුව වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගන්වා ඇති සෙ/505057 කෝප්‍රල් රත්මල්ගම කේඒඑච් යන කොනොනිගේ කැළණිය විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය හදාරනු ලබන පුතණුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් පිරිනැමීමද යුද්ධ හමුදාධිපතිගේ සුරතින් සිදුවිය.

"ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ බ්‍රිතාන්‍ය හමුදාවට සම්බන්ධ වන්නේ 1940 දශකයේ මුල් කාලයේය. අනතුරුව 1943 දෙසැම්බර් 08 වන දින හිරු නොබසින අධිරාජ්‍ය විසින් ඔහුව 2/ලුතිනන්වරයකු ලෙස අධිකාරියට පත්කරනු ලබන අතර, එය සිංහල හමුදා සාමාජිකයකුට රාජකීය අභිමානය පිරිනැමීමක් සේ සැලකිය හැකිය. බ්‍රිතාන්‍ය රජය විසින් හෙට්ටිගොඩ ලියනගේ වෙත ඔහුගේ අධිකාරී පත්වීමට අදාළ අක්ත පත්‍රය පුදනු ලබන්නේ නම්බුනාමයන්ද සමගින් වීම විශේෂත්වයකි"

# රාජකීය අභිමානය රැඳි ශ්‍රී ලාංකේය





# හමුදා උරුමය

යුද බිමට පයගසන්නට හැමෝටම බැරිය. එය කොතරම් අවදානම් වුවද ඒ දුලබ අත්දැකීම් ලැබිය හැකි වන්නේ එහෙමත් කෙනකුට පමණි. සෑම රණවිරුවකු පිටුපසම ඉතිහාස කතාවක් ඇත. ඉන් කියවෙන්නේ කිසිවකු ආවාට ගියාට හමුදාවට එක් නොවන බවයි. එය පෙරුම්පුරා ආ ගමනක මේ භවයේ පිළිබිඹුවයි. රණවිරුවන් වූ සෑම අයකුගේම අතීත ජීවිතයට එබී බැලිය හැකිනම් ශතවර්ෂ ගණනාවක් එපිටදී හෝ වසර දහස් ගණනක් එපිටදී හෝ ඔවුන් යුද භටයන් ලෙස යුද සේවයේ කොහේ හෝ නැනක කටයුතු කොට ඇති බැව් නොඅනුමානය.

1881 අප්‍රේල් මස 01 වන දින ශ්‍රී ලාංකිකයින් හා සුදු ජාතිකයින්ගේ එකතුවෙන් ස්වේච්ඡා හමුදාවක් ලංකාව තුළ මුල්වරට ස්ථාපනය වී ඇත. එය ප්‍රථම පාබල ස්වේච්ඡා බළඇණිය වූ අතර එම බළඇණිය ලංකා ආණ්ඩුකාරවරයා යටතේ පාලනය විය. ලංකා ආණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය යටත් විජිතගාර ලේකම් වෙතින් නියෝග ලබාගත් අතර, යටත් විජිතගාර ලේකම් වික්ටෝරියා මහරජින වෙත වගකිව යුතු විය. මෙම බළඇණිය පාබල බළඇණියක් වූ අතර, එහි සංවිධානය අශ්වාරෝහක කණ්ඩායමක්, කාලතුවක්කු කණ්ඩායමක්, ගිලන්මැසි කණ්ඩායමක්, ඉංජිනේරු කණ්ඩායමක් හා තූර්ය වාදක කණ්ඩායමකින් සමන්විත විය. පසුව ශිෂ්‍යභට කණ්ඩායමක්ද ආරම්භ කරන ලදි.

මෙසේ ඇරඹි ස්වේච්ඡා හමුදාව විවිධ වෙනස්වීම්වලට භාජනය වෙමින් ක්‍රමිකව විකාශනය වී ඇති අතර, එම කාලසීමාව තුළ ශ්‍රී ලාංකිකයින් රැසක්ද එම ඉංග්‍රීසි හමුදාවේ කැපී පෙනෙන මෙහෙවරක් ඉටුකොට ඇති බව පැහැදිලිය. බ්‍රිතාන්‍ය හමුදාවට නැකම් කියූ එම අනලොස්සක් පිරිස දකුණු අප්‍රිකාවේ බෝයර් යුද්ධය මෙන්ම පළමුවන, දෙවන ලෝක යුද්ධ ඇතුළු විදේශීය යුද මෙහෙවරහිද නිරතව ඇත. මෙතෙර අගිමන එතෙර රැන්දූ ඉංග්‍රීසි හමුදාවේ සිටි එම ශ්‍රී ලාංකික යුද භටයින් බ්‍රිතාන්‍ය රජයේ ගෞරව නම්බු නාමයන්ට පවා පාත්‍ර වී ඒ වෙනුවෙන් පදක්කම්ද හිමි කරගෙන ඇත.



පසු පෙළේ දකුණේ සිට දෙවැනියට 2/ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ

එවක බ්‍රිතාන්‍ය හමුදාවේ සේවය කළ අතලොස්සක් පිරිස අතර වූ සුවිශේෂ චරිතයක් පිළිබඳව වර්තමානයෙහිද අපට ආඩම්බරයෙන් කතාකළ හැකිය. ඊට හේතුව මේ වනවිට ඔහු ජීවතුන් අතර නොසිටියද ඔහුගේ ලේ උරුමයෙන් අදද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පන්නරය ලබාදී ඇති හෙයිනි. ඒ අන්කිසිවකු නොව වත්මන් යුද්ධ හමුදාවේ යුද්ධ හමුදාධිපති ධූරය හොබවන ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්ඩබ්ලිව්පී එන්ඩියූ ගේ ආදරණීය පියාණන්ය.

නමින් හෙට්ටිගොඩ ලියනගේ වන ඔහු බ්‍රිතාන්‍ය හමුදාවට සම්බන්ධ වන්නේ 1940 දශකයේ මුල් කාලයේය. අනතුරුව 1943 දෙසැම්බර් 08 වන දින හිරු නොබසින අධිරාජ්‍ය විසින් ඔහුව 2/ලුතිනන්වරයකු ලෙස අධිකාරියට පත්කරනු ලබන අතර, එය සිංහල හමුදා සාමාජිකයකුට රාජකීය අභිමානය පිරිනැමීමක් සේ සැලකිය හැකිය. බ්‍රිතාන්‍ය රජය විසින් ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ වෙත ඔහුගේ අධිකාරී පත්වීමට අදාළ අක්ත පත්‍රය පුදනු ලබන්නේ බොහෝ ගෞරවනීය නම්බුනාමයන්ද සමගින් වීම විශේෂත්වයකි. එම අක්ත පත්‍රය ලියවී ඇති ස්වභාවය දෙස බැලීමේදී ඒ බැව් කදිමට සනාථ වේ.

**"ශ්‍රේෂ්ඨ හිරු නොබසින අධිරාජ්‍යයේද සයුරු රළින් එහා භූමියේ හා පෙරදිග ඉන්දියාවේද සර්වාධිකාරී වූ ශ්‍රේෂ්ඨ 6 වන ජෝර්ජ් රාජෝත්තමයන්ගේ නාමයෙන්, ශ්‍රේෂ්ඨ ශාන්ත ජෝර්ජ් සහ ශාන්ත මයිකල් ප්‍රසාදි නයිට් පදවි ධුරන්ධර, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ විශිෂ්ටතම සෙන්පතියා වූද ලංකාව ඇතුළු බොහෝ බ්‍රිතාන්‍ය යටත් විජිතයන්ගේ පාලන ධුරන්ධර සර් ඇන්ඩෲ කෝල්ඩර්කොට් මැතිතුමා විසින් මෙය 2/ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ වෙත ප්‍රදානය කරන වගයි. (1943 දෙසැම්බර් 8 වන දින කොළඹදී)"**

**1910 අංක 8 දරණ ආඥාපනතේ වගන්ති ප්‍රකාරව සර්වෝත්තම පාලන අධිකාරී සර් ඇන්ඩෲ කෝල්ඩර්කොට් උතුමාණන් වෙත පැවරී ඇති බල ප්‍රකාරයන්ට අනුකූලව මනා යහපැවැත්ම සහ විනයධර ලංකාවේ ස්වදේශ හමුදාවන්ගේ සාමාජිකයන් විසින් ඔවුන් වෙත පලකරන ලද්දාවූ විනයගරුකත්වය, රාජ පාක්ෂිකත්වය, අවංකභාවය සහ ධෛර්යය උදෙසා හෙට්ටිගොඩ ලියනගේ මහතා ලංකා ආරක්ෂක හමුදාවේ ලංකා පාබල**



*කුඩා විකුම් ලියනගේ (ඡායාරූපයේ මැද) සිය දෙමාපියන් හා සහෝදර සහෝදරියන් සමග*

**හමුදාවේ 2/ලුතිනන් ධූරයට මෙලෙස අධිකාරියට පත්කරනු ලැබේ. ඒ අනුව එහි පදවියට උරුම වන්නා වූ සියලුම හිමිකම්ද වරප්‍රසාදයන්ද, බලපුලුවන්කාරකම් ආදිය මෙහි 2/ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ වෙත මෙලෙස පැවරෙන වගයි"**

ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ වෙත බ්‍රිතාන්‍ය රජයේ පිළිගැනීම හා ගෞරවය කොතෙක්ද යන්න ඉහත අක්තපත්‍රයේ ලියවී ඇති ආකාරය කදිමට සනාථ කරයි.

එසේම, බ්‍රිතාන්‍ය පාලන සමයේදී සහ ඩොමිනියන් ආධිපත්‍ය මුල් භාගයේදී බ්‍රිතාන්‍ය රජතුමා විසින් සිංහල හමුදාව වෙත ගෞරව නාම හා පදක්කම් පවා පිරිනමා ඇත. එහිදී, නිලධාරීන් හා සෙබළුන් දෙපිරිසටම එලෙස පදක්කම් හා ගෞරවනාම ලබාදීම විශේෂත්වයකි.

යටත් විජිත සහායක බලකා නිලධාරී ගෞරව නාමය

යටත් විජිත සහායක දීර්ඝ සේවා පදක්කම 1899 - 1930

කාර්යක්ෂමතා විභූෂණය *(ED)* නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා පදක්කම සෙබළුන් සඳහා 1930 - 1972

ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ ද බ්‍රිතාන්‍ය රජය වෙතින් ලද ගෞරව පදක්කම 04 කට හිමිකම් කියූ අතර, ඒවා ඔහු හමුදා සේවයේ යෙදී සිටියදී පෑ දක්ෂතා හා වීරත්වය වෙනුවෙන් ලැබූ විරල ගණයේ පදක්කම්ය. ඒවානම්, ***Defence Medal, War Medal, Coronation Medal 1953, Efficiency Decoration*** ඔහු එලෙස හිමිකරගත් පදක්කම්ය.

1948 පෙබරවාරි 04 වන දින නිදහස ලැබූ ශ්‍රී ලංකා හමුදාවක් මෙරට තුළ බිහිවීමත් සමගම එතෙක් සුදු ජාතිකයින් යටතේ කටයුතු කළ මෙරට හමුදා සාමාජිකයින්ගේ යුගයද සහමුලින්ම අවසන් විය. වර්තමානය වනවිට එදවස බ්‍රිතාන්‍ය හමුදාවේ එම දුලබ අත්දැකීම් ලැබූ සාමාජිකයින් කිසිවකුත් ජීවතුන් අතර ඇත්දැයි සැක සහිතය. නමුත්, ඔවුන් පිළිබඳව වන මතක වත්මන් හමුදා පරපුරටද කදිම පූර්වාදර්ශයක් සේම වටිනාකමක්ද ගෙනදෙනු නොඅනුමානය.

සිය පියා පිළිබඳව ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ තුළ ඇත්තේ ගෞරවනීය මතකයකි. ඔහුගේ යුද හමුදා ආගමනයට තම පියාගේ

පෞරුෂය හා අභිමානය සාප්‍රවම ඉවහල්වී තිබිණ. තම පියා පිළිබඳව අභිනාවර්ජනයක යෙදෙන පුතු විකුම් ලියනගේට ඒ හරහා දැනෙනුයේ තම පියා යළිදු ජීවත්වන සෙයකි. එසේම, ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ පියා තුළද තම පුතු තමන් සේම හමුදා අධිකාරියක් දරනු දැකීම අභිප්‍රාය වී තිබිණ.

විකුම් ලියනගේ යුද හමුදාවට එක්වන අවධිය වනවිට සිය පියා බ්‍රිතාන්‍ය හමුදාවෙන් ඉවත්ව බොහෝ කල් ගතවිය. සැබවින්ම පියාගේ හමුදා දිවිය පිළිබඳව ඔහු තුළ ඇත්තේ බොඳවුණු මතකයන් වුවද ඉන් අනතුරුව ගෙවූ කාල පරිච්ඡේදය පිළිබඳ බොහෝ මතක ඉතිරිව ඇත. එසේම, 1986 වසරේ ඔහු යුද හමුදාවට එක්වූ මුල් කාලවකවානුව වනවිට සිය පියා ඔහුගේ දිවියේ අවසන් භාගයට එළැඹ තිබීම පිළිබඳව ඔහු තුල ඇත්තේද කනගාටුවකි. 2/ලුතිනන් වරයකු ලෙස විකුම් ලියනගේට තම පියා දක්නට ලැබෙනුයේද යුද හමුදාවට එක්ව ගතකළ නිවාඩු වාරයකදී හෝ දෙකකදී පමණි. කෙසේ වුවද, අදටද ඔහු ආඩම්බරයෙන් ආවර්ජනය කරන පියා පිළිබඳ වූ අමරණීය මතක කිසිදු ලෙසකින් ඔහු තුළින් ගිලිහී නොයයි.

ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ මහතාගේ දින චරියාව වෙනස්ම එකක් විය. යුද හමුදාවෙන් ඉවත් වුවද ඉන් ලද ආභාෂය ඔහුගේ සාමාන්‍ය ජීවිතය තුළින් බොහෝ විට ඉස්මතුව පෙනුණි. අලුයම අවදිවන ඔහු දවස අරඹන්නේම ව්‍යායාමවලට මුල්තැනක් දෙමිනි. එහිදී, ඔහුගේ වැඩි නැඹුරුව කායවර්ධන ව්‍යායාමවලටය. එසේම, යුරෝපීය ඇඳුමින් සැරසී කළුපළි බසින ඔහුගේ පාවහන්වල දිස්නයත් ආඩම්බර ගමනේ විලාසයත් දකින ඕනෑම අයකු තුළ ඔහු පිළිබඳ විශේෂත්වයක් දැනවිය. ඔහුගේ මෙම ක්‍රියාකාරකම් දෙස අන්අයට වඩා මහත් විමසිලිමත්වූ දෑසක් විය. ඒ අන් කිසිවකු නොව ඔහුගේ පුත් විකුම් ලියනගේය.



In the Name of His Majesty GEORGE THE SIXTH, by the Grace of God of Great Britain, Ireland [illegible]
beyond the Seas King, Defender of the Faith, Emperor of India.
BY HIS EXCELLENCY
SIR ANDREW CALDECOTT,
KNIGHT GRAND CROSS OF THE MOST DISTINGUISHED ORDER OF SAINT MICHAEL AND SAINT GEORGE,
COMMANDER OF THE MOST EXCELLENT ORDER OF THE BRITISH EMPIRE, GOVERNOR
IN AND OVER THE ISLAND OF CEYLON AND ITS DEPENDENCIES.
To [illegible]
By virtue of the power and authority in me vested under the provisions of the Ordinance No. [illegible] of 1910, entitled "An Ordinance to make better provision for the good Order and Discipline of the Local Forces in Ceylon," I, the said Governor reposing especial trust and confidence in the loyalty, integrity, and courage of you, the said [illegible] have thought fit to nominate, constitute, and appoint, and by these Presents do constitute, appoint and commission you, the said [illegible], to be [illegible] Corps of the Ceylon Defence Force.
And I, the said Governor do hereby give and grant to you, the said [illegible], or in such higher Rank to which you may be hereafter promoted or appointed, of which a Notification will be made in the Ceylon Government Gazette, all the rights, duties, powers, and privileges which attach and of right belong to the said Office.
And I, the said Governor, do hereby require you to train, exercise, and discipline the Inferior Officers and other persons armed and arrayed under your command, and to obey all the lawful orders of your Superior Officers according to the rules and discipline of war, and in compliance with the laws in that behalf made.
Given under Our hand and the Seal of the Island of Ceylon at [illegible], in the said Island, this [illegible] of [illegible], in the year of our Lord One thousand Nine hundred and [illegible].
By His Excellency's command.

ලුතිනන් හෙට්ටිගොඩ ලියනගේ අධිකාරියට පත් කරමින් බ්‍රිතාන්‍ය රජය විසින් පිරිනැමූ අණපත්‍රය

කුඩා කල පටන් තම පියාගේ සෙවණේම හැදී වැඩුණු ඔහු තුළින් පියාගේ ගතිලක්ෂණ නිරතුරුව දක්නට ලැබුණි. උදෑසන ව්‍යායාම අතරතුරේදී ක්‍රමානුකූල දිවිපෙවෙතට හා යහපත් සිරිත් විරිත් විකුම් ලියනගේ පුතුට හුරු කරවන්නට ඔහු යත්න දැරීය. කොතරම් දඟකාර ගති පෙන්නුම් කළද, විකුම් පුතු සිය පියා ඉදිරියේ තීකරු වන්නට වගබලා ගත්තේ ඔහු රාජකීය හමුදාවේ නිලධාරියකු බැව් අවබෝධ කොටගෙන තිබූ නිසාමය.

සිය පියා තරුණ වියේදී ඇඳි ඉංග්‍රීසි පන්නයේ ඇඳුම් පැළඳුම් පිළිබඳ පුතු විකුම් ලියනගේ තුළද වූයේ කැමැත්තකි. දෙපසින් බකල් අල්ලා කර හරහා පටි දෙකකින් එල්ලන ලද තම පියා විසින් අඳිනු ලැබූ කලිසම එම යුගයේ බොහෝ ජනප්‍රිය බටහිර විලාසිතාවක් වූ අතර එය ඔහුගේද තේරීම විය. පියාගේ එම ඇඳුම් පැළඳුම් ඇඳ පාසල වෙත ගිය විකුම්ට සම වයසේ යහළුවන් විටෙක විහිළු තහලු කළ මතකයක්ද ඔහු සතුය.

ලංකා හමුදාවේ ආරම්භක පාබල සාමාජිකයකුව සිද සුදු අධිරාජ්‍යයට නැකම් කියූ පියකුගේ පුතකු වන්මන් ශ්‍රී ලංකා යුද හමුදාවටද නායකත්වය සැපයීම දෛවෝපගත සිදුවීමක් සේම ඓතිහාසික දුලබ අවස්ථාවකි. සිය පියා රාජකාරි කළ ඉංග්‍රීසි යුගයේ මෙරට හමුදාවල තිබූ ස්වභාවයට වඩා හාත්පසින් වෙනස් වටපිටාවක සාප්‍රව හා වකුව එල්ලවන ආර්ථික සමාජීය මෙන්ම ගෝලීය බලපෑම් හමුවේ ශ්‍රී ලංකා යුද හමුදාව සාප්‍රව නිසි මාවතේ රැගෙන යාම සුළුපටු අභියෝගයක් නොවේ. යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ හට අවසන් මොහොත තෙක් තම පියාගෙන් ලද පරිචය එකී අභියෝග ජයගැනීමෙහිලා සාප්‍ර පිටුවහලක්ව ඇති බැව් නොඅනුමානය. ඓතිහාසික මාතලේ ප්‍රදේශයේ ඉපිද සිය පියාගේ අඩිපාරේ යමින් ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේද වත්මන් යුද හමුදාවට නායකත්වය සපයනුයේ දශක තුනහමාරක් ඉක්ම වූ අත්දැකීම් සම්භාරයකින් යුත් පරිනත නිලධාරියකු ලෙසිනි. එදවස සටන් බිමෙහි පෙරමුණේ වගකීම් දැරූ ගෙනෙම දෙවනාවක්ම සතුරු උණ්ඩවලට ගොදුරුව තුවාල ලැබුවකුද වේ. රට වෙනුවෙන් වූ සිය අනුලංඝනීය වගකීම නිසි ලෙස ඉටුකිරීමට ඔහුට සිය පියාගෙන් ලද පන්නරයද රාජකීය උරුමයද යෝධ සෙවණැල්ලක්ව ඇති බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.



ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ

# පාසල් කරාටේ ශූරයින් දිරිගැන්වේ

මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ ඉකුත් අගෝස්තු 25 වන දින උදෑසන සංචාරයක නිරත වූ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ අලවකුඹුර මධ්‍ය මහා විද්‍යාලයේ ජූනි මස සිට පැවති සමස්ත ලංකා "කාතා" කරටේ ශූරතාවලියේදී රන් පදක්කම් 12 ක් සහ රිදී පදක්කම් 19 ක් දිනාගනිමින් දස්කම් දැක්වූ සිසුන් 31 දෙනකු හමුවී ඔවුන් දිරිමත් කරමින් ක්‍රීඩා උපකරණ සහ මූල්‍ය පරිත්‍යාගයක් සිදුකළේය.

එහිදී, යුද්ධ හමුදාධිපති විසින් එම ජයග්‍රාහකයින් මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසල වෙත කැඳවා එලෙස රුපියල් මිලියනයකට අධික වටිනාකමකින් යුත් ක්‍රීඩා උපකරණ තොගයක් ප්‍රදානය කිරීමටද කටයුතු කරන ලදී. තවද, විවිධ දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන පවුල්වල දරුවන් සිටින මෙම පාසලේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිරිගැන්වීමේ අරමුණින් එම පාසලට රුපියල් 100,000.00 ක මුදල් පරිත්‍යාගයක්ද සිදුකරනු ලැබීය. මෙම ග්‍රාමීය පාසල් දරුවන් සඳහා වසරේ මුල් භාගයේ පැවති සමස්ත ලංකා "කාතා" ශූරතාවලියට සහභාගී වීමට කොළඹට පැමිණීමේ වියදම දෙමව්පියන්ට දරාගැනීමට නොහැකිව ඒ පිළිබඳ ශූරතාවලියට දින දෙකකට පෙර යුද්ධ හමුදාධිපති දැනුවත් කිරීමෙන් පසු එතුමන්ගේ උපදෙස් මත ඔවුනට හමුදා බස් රථයකින් කොළඹට පැමිණීමට පහසුකම් සලසාදීමට පවා කටයුතු කරනු ලැබීය.



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක රාජකාරි අරඹයි





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී ප්‍රස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පසුගිය අගෝස්තු මස 17 වන දින කොස්ගම, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථාන පරිශ්‍රයේදී හමුදා සම්ප්‍රදායානුකූලව සහ ආගමික වතාවත් මධ්‍යයේ රාජකාරි භාරගත්තේය. වසර 36 ක් ඉක්මවූ සිය දීර්ඝ සේවා කාලය තුළ විවිධ මට්ටම්වල තනතුරු රැසක් දරා ඇති නිලධාරියකු වූ එතුමන් ක්‍රියාන්විතයේදීද කැපී පෙනෙන මෙහෙවරක් සිදුකොට ඇති දක්ෂ නිලධාරියෙකි. හෙතෙම නව තනතුර භාරගැනීමට ප්‍රථම බටහිර ආරක්ෂක සේනා ආඥාපති ලෙසද කටයුතු කරනු ලැබීය.



# අභීත සෙන්පතියන්ගේ 31 වන ගුණානුස්මරණය







සන්නාහ සන්නද්ධ බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් හා මඟපෙන්වීම මත එම බලකායට අයත් නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් අනුරාධපුර රෝහල් වටරවුමේ ඉදිකර ඇති ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව පිළිරුව අභියසදී ඉකුත් අගෝස්තු 08 වන දින අනුස්මරණ උත්සවයක් පැවැත්විණ. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ සහභාගී විය. මෙම අවස්ථාව සඳහා ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ජ්‍යේෂ්ඨ නිලධාරීගේ ළඟම ඥාතීන් ඇතුළු ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් ද එක්වූහ.





අප මාතෘභූමියේ ඒකීයභාවයත්, භෞමික අඛණ්ඩතාවයත් සුරක්ෂිත කරමින් නිදහස් හා නිවහල් රටක් නිර්මාණය කරන්නට තම ජීවිත කැපකළ ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව අභීත රණවිරුවා ඇතුළු යුද හා නාවික හමුදා රණවිරුවන් සිහිකරමින් සංවිධානය කෙරුණු 31 වන අනුස්මරණ දිනය 2023 අගෝස්තු 08 වන දින යාපනය අරාලි තුඩුවේ පිහිටි එම ස්මාරකය අභියසදී පැවැත්විණ. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සැමරුම් අවස්ථාව සඳහා සේනාංකාධිපතිවරු, නියෝජ්‍ය ආඥාපති - උතුරු නාවික විධානය, බලසේනාධිපතිවරු, ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

වැලිකන්ද ප්‍රදේශයේ බුද්ධ ශාසන චිරස්ථිතිය වෙනුවෙන් ඉමහත් මෙහෙවරක් ඉටුකළ පුද්ගලයින් සඳහා දේශප්‍රේමී ගෞරව නාමය ප්‍රදානය කිරීමේ උත්සවයක් දිඹුලාගල ශාසනාරක්ෂක බලමණ්ඩලය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබයි. දේශහිතෛෂී, දේශමාමක, මහජන ආරක්ෂාව සහ සුබසිද්ධිය වෙනුවෙන් ජීවිතය කැපකරන රණවිරුවන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ කාර්යය අගයා වාර්ෂිකව මෙම ගෞරව නාමය පුදකරනු ලබයි.



# "ජනජය සාධන සමග්‍ර ශ්‍රී දේශබන්ධු"

## ගෞරව නාමයෙන් පිදුම් ලබයි





වැලිකන්ද ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් කරන ලද කැපවීම වෙනුවෙන් සහ විශේෂයෙන් සමාජ සංස්කෘතික හා ආගමික කටයුතු වෙනුවෙන් කරන ලද සේවය ඇගයීම වස් "ජනජය සාධන සමග්‍ර ශ්‍රී දේශබන්දු" ගෞරව දේශප්‍රේමී සම්මානය යාපනය ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී (නැගෙනහිර හිටපු ආරක්‍ෂක සේනා ආඥාපති) වෙත ඉකුත් ජූලි 30 වන දින වැලිකන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේදී ප්‍රදානය කෙරිණ. මෙම ගෞරව දේශප්‍රේමී සම්මානය "දිඹුලාගල ආරණ්‍ය සේනාසනාධිපති නමන්කඩුව දෙපලාතේ ප්‍රධාන සංඝනායක, බුද්ධශ්‍රාවක සංඝ සභාවේ ගරු සභාපති" අතිපූජ්‍ය සිංහපුර චේතියාලංකාර නායක ස්වාමින් වහන්සේ අතින් පිරිනැමිණි.

තවද, මීට සමගාමීව නැගෙනහිර ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී සහ ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් එස්ඩී කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී වෙතද "ජනජය සාධන සමග්‍ර ශ්‍රී දේශබන්දු" ගෞරව දේශප්‍රේමී සම්මානය පිරිනැමිණ. තවද, දහම් පාසල් සිසුන් සඳහා ශිෂ්‍ය නායක අක්තපත්‍ර ප්‍රදානය කිරීම සහ නිල ලාංඡන පැළඳවීමද එහිදී පැමිණි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතින් සිදුවිය. මෙම අවස්ථාව සඳහා දිඹුලාගල ශාසනාරක්‍ෂක බලමණ්ඩලයේ මහ සංඝරත්නය, නිලධාරීන් සෙසුනිලයින් ඇතුළු ප්‍රදේශයේ ජනතාව විශාල පිරිසක් සහභාගී වූහ.

# ඉන්දීය රණවිරුවන් අනුස්මරණය කෙරේ





යාපනය පලාලි හි පිහිටා ඇති ඉන්දීය රණවිරු ස්මාරකය අභියසදී ඉන්දීය සාමසාධක හමුදාවේ මියගිය රණවිරුවන් සිහිපත් කිරීමේ උත්සවය යාපනයේ පිහිටි ඉන්දීය කොන්සල් ජෙනරාල් කාර්යාලයේ ප්‍රධානි මෙරට ඉන්දීය නියෝජ්‍ය මහ කොමසාරිස් රාකේෂ් නිට්රාජ් ජයබාස්කරන් මහතා සහ ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අගෝස්තු 15 වන දින පැවැත්විණ. ඉන්දීය 76 වන නිදහස් දිනයට සමගාමීව සංවිධානය කෙරුණු එම සැමරුම් උත්සවයේදී එල්ටීටීඊ ත්‍රස්තවාදයට එරෙහි මෙහෙයුම්වලදී 1987 වර්ෂයේ සිට 1990 වර්ෂය දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේදී මියගිය ඉන්දීය සාමසාධක හමුදාවේ රණවිරුවන් සිහිපත් කෙරිණ. මේ කාලය තුළ පැවති යුද්ධයේදී මියගිය ඉන්දීය හමුදා නිලධාරීන් හා සෙබළුන් සංඛ්‍යාව 1138 ක් ලෙසද තුවාල ලැබූ සංඛ්‍යාව 2762 ක් ලෙසද වාර්තා වේ.







# අනුරාධපුර අටමස්ථාන සංචාරයේ මතක සටහන්

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩියූ විසින් නව තනතුරෙහි වැඩ ඇරඹීමෙන් අනතුරුව අනුරාධපුරය අටමස්ථාන වැඳපුදා ගැනීම පසුගිය ජූලි 28 වන දින සිදුකරන ලදී.

එහිදී ආඥාපති, අටමස්ථානාධිපති පූජ්‍ය පල්ලේගම හේමරත්න නායක ස්වාමීන් වහන්සේ සහ රුවන්වැලිසෑය, ථූපාරාමය, ගංගාරාමය, අභයගිරිය, ඉසුරුමුණිය, ජයන්ති විහාරය, මිරිසවැටිය සහ මිහින්තලය යන විහාරස්ථානයන්හි විහාරාධිපති හිමිවරුන් හමුවී ආශිර්වාද ලබාගත්තේය.

# වන්නි ආඥාපති 54 වන සේනාංකයේ සංචාරයක

මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩියූ ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ලෙස රාජකාරි ඇරඹීමෙන් පසු පසුගිය ජූලි 24 වන දින 54 වන පාබල සේනාංකය යටතේ පාලනය වන බලසේනා හා බළඇණිවල සංචාරයක නිරතවිය.

එහිදී, 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්ජී සෙනෙවිරත්න යූඑස්පී පීඑස්සී විසින් ආඥාපති හට බලප්‍රදේශය තුළ සිදුකරනු ලබන ක්‍රියාත්මක හා පාලන කටයුතු සම්බන්ධව දැනුවත් කිරීමක්ද සිදුකරන ලදී. සිය සංචාරයේදී සියලු නිලධාරීන් හා සෙසුනිලයින් ඇමතූ ආඥාපති ඔවුනගේ අවශ්‍යතා හා ගැටළු පිළිබඳ සොයාබලමින් අවශ්‍ය විසඳුම් ලබාදීමටද ක්‍රියාකළේය. එමෙන්ම හෙතෙම මන්නාරම රදගුරු ෆෙඩිලිස් ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමන් හමුවී ආශිර්වාද ලබාගැනීමටද අමතක නොකළේය.







# ශ්‍රී ලංකාවේ ඇමෙරිකා එක්සත් ජනපද තානාපති තුමිය සංචාරයක





ශ්‍රී ලංකාවේ ඇමෙරිකා එක්සත් ජනපද තානාපති ජුලී චන්ග්, ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් ඇන්තනී සී නෙල්සන් සහ සහකාර ආරක්ෂක උපදේශක සෙත් හෙවින්ස් මහතා ඉකුත් අගෝස්තු 24 වන දින 1 බලකායේ සංචාරයක නිරතවූහ.

එහිදී 1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් එම බලකා මූලස්ථානය වෙත පැමිණි ඇමෙරිකා එක්සත් ජනපද තානාපති තුමිය උණුසුම් අයුරින් පිළිගන්නා ලදී. මෙම සුහද හමුවේදී බලකාධිපති සහ තානාපති ජුලී චන්ග් මහත්මිය දෙරට අතර පවතින ද්විපාර්ශ්වික සබඳතා සහ සුහසාධන ව්‍යාපෘති පිළිබඳව අදහස් හුවමාරු කරගත්හ.

# 1 බලකාධිපති කඳවුරු සංචාරයක

1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් අගෝස්තු 05 වන දින කුරුණෑගල බෝයගනේ ස්ථානගත 6 වන බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ කඳවුරු සංචාරයක නිරතවිය. එම විශේෂ අවස්ථාව සනිටුහන් කරමින් කඳවුරු සම්මාන මුරයක් පැවැත්වීම, හටපිරිස් ඇමතීම, සමූහ ඡායාරූපයකට පෙනීසිටීම සහ දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම ප්‍රධාන විය. තවද, මෙදින 6 වන බලඇණියේ පැදුරු සංගීත කණ්ඩායම පළමු වරට එළිදැක්වීමද සිදුවිය. එම අවස්ථාවට 58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 1 බලකායේ බ්‍රිගේඩියර් ප්‍රමානි, 6 වන බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන්, සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.





# මුලතිව් ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) හි සංචාරයක





ආරක්‍ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ඉකුත් අගෝස්තු 02 වන දින ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) සහ ඒ යටතේ පාලනය වන සියලුම හකාස ඒකකයන්හි සංචාරයක නිරතවිය. ප්‍රථමයෙන් ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) වෙත සංචාරය කළ ආඥාපති අනතුරුව යුද්ධ හමුදා රෝහල (මුලතිව්), 6 වන විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය, 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ සංචාරයන් සිදුකරන ලදී. සිය සංචාරයේදී සියලු නිලධාරීන් හා සෙසුනිලයින් ඇමතු ආඥාපති ඔවුනගේ අවශ්‍යතා හා ගැටළු පිළිබඳ සොයාබලමින් අවශ්‍ය විසඳුම් ලබාදීමටද ක්‍රියාකළේය.



# හිසට සෙවණක්

ආරක්‍ෂක සේනා (මුලතිව්) ආඥාපතිගේ මගපෙන්වීම මත 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මෙහෙයවීමෙන් යුද්ධ හමුදාව සහ එම බලප්‍රදේශයේ සිවිල් වැසියන් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් පවත්වන ලද වැඩසටහන් මාලාවේ තවත් පියවරක් ලෙස තෝරාගත් දිළිඳු පවුලක් සඳහා නව නිවසක් ඉදිකර භාරදීම 3(සේව) බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් ඉකුත් ජූලි 31 වන දින සිදුකරන ලදී.

05 වන කොට්ඨාශය, ඉරණපලෙල, පුදුකුඩිඉරිප්පු යන ලිපිනයේ පදිංචි ත්‍යාග රාජා යන අය වෙත රුපියල් 2000,000.00 ක් වටිනා නව නිවස භාර කෙරුණු අතර, පරිත්‍යාගශීලීන්ගේ භාණ්ඩ හා මූල්‍ය පරිත්‍යාගයෙන් සහ 3(සේව) බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තු භටපිරිස් ඊට ශ්‍රම දායකත්වය සැපයූහ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක සේනා (මුලතිව්) ආඥාපති සහභාගී විය.





# යෝගට් නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කෙරේ



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය විසින් එහි සේවා වනිතා ශාඛාව වෙත අරමුදල් රැස්කිරීමේ අරමුණින් ඉකුත් අගෝස්තු 15 වන දින නව යෝගට් නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. එම යෝගට් නිෂ්පාදනාගාරය විවෘත කිරීමේ අවස්ථාවට ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මෙන්ම යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හිමාලි පුස්සැල්ල මහත්මිය එක්වූහ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා පොදුසේවා බලකායේ සාමාජිකාවෝ රැසක්ද සහභාගී වූහ.

# යුද්ධ හමුදා සෙබළුන්ගේ දැනුම වර්ධනයට දේශනයක්






ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන්රථ හමුදාවේ ප්‍රධාන කොමසාරිස් මහනුවර ජීවන මාර්ගෝපදේශන ඒකකයේ අනුශාසක මධ්‍යම පළාත් ශාන්ත ජෝන් ගිලන්රථ හමුදාවේ සභාපති විශේෂඥ වෛද්‍ය ජේඑම් නිලාම් *MBBS DCH MD* සහ ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන්රථ සේවයේ ගම්පහ දිස්ත්‍රික් කොමසාරිස් රුවන් ශ්‍රී බාලසූරිය යන මහත්වරු විසින් යුද්ධ හමුදා සෙබළුන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා හරවත් දේශනයක් 2(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් සංවිධානය කරනු ලැබීය. එම දේශනය තුළින් යුද්ධ හමුදා සාමාජිකයින්ගේ රාජකාරී මෙන්ම සිවිල් ජීවිතය සමබරව පවත්වාගෙන යාම සහ රාජකාරියේදී පැනනැගෙන පොදු මානසික ආතතියන් දුරුකරලීමේ නව ක්‍රමවේදයන් ඇතුළත් වන පරිදි නිරෝගී මනසක් යනු කුමක්ද සහ තවත් මාතෘකා රැසක් ඔස්සේ මෙමගින් දැනුම ලබාදෙන ලදී. මෙම දේශනය සඳහා 144 වන පාබල බලසේනාව යටතේ රාජකාරී නියුතු භටපිරිස් 150 ක පමණ පිරිසක් සහභාගී වූහ.

# ආරක්‍ෂක සේනා මධ්‍යම ආඥාපති මල්වතු, අස්ගිරි මහානාහිමිවරු බැහැදැක ආශිර්වාද ලබාගනියි





ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති ලෙස ධූරයේ රාජකාරි භාරගන්නා ලද මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩියූ පීඑස්සී ඉකුත් අගෝස්තු මස 12 - 17 යන දින තුළදී අස්ගිරි පාර්ශ්වයේ මහනායක අතිපූජ්‍ය මහා විහාර වංශික වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඥාණරතනාභිධාන මහා නායක ස්වාමින් වහන්සේ, මල්වතු පාර්ශ්වයේ මහානායක අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිදාන මහා නායක ස්වාමින් වහන්සේ සහ අතිපූජ්‍ය අග්ගමහාසද්ධම්මජෝතික ශාසන කීර්ති ශ්‍රී නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ෂිත විජිතසිරි අනුනායක මාහිමිපාණන් ප්‍රධාන අනෙකුත් අනුනායක හිමිවරුන් බැහැදැක ආශිර්වාද ලබාගත්හ. තවද, මෙම අවස්ථාවට 111 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එස්එන් ඇඹගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ද එක්වූහ.

## "සෙබළ සිතට දහම් සිසිල" කාලීන සුමදුර ධර්ම දේශනාව





ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපතිගේ පූර්ණ අධීක්‍ෂණයෙන් "සෙබළ සිතට දහම් සිසිල" කාලීන සුමදුර ධර්ම දේශනාවක් පවත්වන ලදී.

17 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සංවිධානත්වයෙන් පසුගියදා එම කඳවුරු පරිශ්‍රයේ පැවති කාලීන ධර්ම දේශනාව අති පූජ්‍ය වැලිමඩ සද්ධාශීල ස්වාමීන් වහන්සේ විසින් මෙහෙයවන ලදී. මෙම අවස්ථාවට ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති, 8 යුද්ධ හමුදා සේවා බලකාය, 7 වන පොලිස් සේවා බලකාය, 2(සේවා) විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය, 4(සේවා) යුධෝපකරණ බලකාය සහ යුද්ධ හමුදා මූලික රෝහල (දියතලාව) අණදෙන නිලධාරීන් ඇතුළු එම ඒකකයන්හි නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් 600 කට අධික පිරිසක් සහභාගී වූහ.

# දිළිඳු පවුලකට හිසට සෙවණක්



52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් වයිඑම්බීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ මිරුසුවිල් ප්‍රදේශයේ පදිංචි දිළිඳු පවුලකට නව නිවසක් ඉදිකරදීම සඳහා මුල්ගල තැබීම ඉකුත් අගෝස්තු 02 වන දින එම සේනාංකාධිපතිගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. "*Imagine Compassion*" යන රාජ්‍ය නොවන සංවිධානයේ මූල්‍ය දායකත්වයෙන් 523 වන පාබල බලසේනාවේ අධීක්ෂණය මත සිදුකළ එම නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා 11 වන ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව ශ්‍රම දායකත්වය සැපයීය.

# හානියට පත් නිවස නවීකරණය කෙරේ





ගල්වැවල රඹකැප්පුවැව, තිත්තගෝනෑව ප්‍රදේශයේ පදිංචි අන්ධ පවුලකට අයත් නිවසක් අලි ප්‍රහාරයකින් දැඩිලෙස හානියට පත්ව තිබිණ. එම නිවස නවීකරණය කර නිවැසියන් වෙත භාරදීම ඉකුත් අගෝස්තු 04 වන දින 62 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ ප්‍රධානත්වයෙන් සිදුවූ අතර, නිවසේ ආරක්ෂාව සඳහා අලිවැටක්ද ඉදිකරදෙන ලදී. 5(සෙව්) ගජබා රෙජිමේන්තුවේ සහ 62 වන පාබල සේනාංකයේ ඉංජිනේරු සේවා භටපිරිස් විසින් මෙම නිවස නවීකරණ කටයුතු සිදුකළ අතර, ඒ සඳහා මූල්‍ය දායකත්වය "*Auto Lanka Land Vehicle Imports*"අධිපති යෝගා පෙරේරා සහ සුසන්ත ජයසුන්දර යන මහත්වරු විසින් ලබාදෙන ලදී.



# දැනුම වැඩුමට අත්වැලක්




අම්පාර, අරන්තලාව, නුවරගලතැන්න පාසලේ අඩු ආදායම්ලාභී සිසු සිසුවියන් 161 ක් වෙත පාසල් උපකරණ සහ නිල ඇඳුම් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 31 වන දින පැවැත්විණ. මෙහිදී, රුපියල් 15000.00 කට අධික වටිනාකමකින් යුත් ත්‍යාග පාර්සලය බැගින් ලබාදුන් අතර, පාසල් සිසු සිසුවියන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ඔවුන් දිරිගැන්වීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය. තවද, එම පාසලේ පුස්තකාලයට අවශ්‍ය පොත්පත් පරිත්‍යාග කිරීමද ගුරුවරුන්ගේ කැපවීම සහ සේවය අගයනු වස් ඔවුන් වෙනුවෙන් විශේෂ ත්‍යාග පිරිනැමීමද මෙහිදී සිදුවිය.

24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් චන්ද්‍රසිරි ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී ගේ සම්බන්ධීකරණයෙන් ආදි ආනන්ද 95 වන කණ්ඩායම විසින් මෙම සත්කාරය සඳහා අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, ආදි ආනන්ද 95 වන කණ්ඩායමේ ඉෂාන් පෙරේරා මහතා ඇතුළු සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.

## යුද්ධ හමුදාවෙන් දෙපයට වාරු දෙමින්

අංක 209, පිහිටි වැව, නුවරගල ලිපිනයේ පදිංචි ආර්පී හාගයා සෙව්වන්දි යන දියණිය කලක පටන් සිය දෙපා අඩපනවීම හේතුවෙන් රෝගාතුරුව පසුවූ අයෙකි. පසුව යුද්ධ හමුදා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පාලනය වන ගාල්ලෙහි පිහිටි සැලසුම කාර්මිකාගාරය වෙත ඇය අතුළත් වී ඇත. එහිදී, වසර එකහමාරක් පමණ ප්‍රතිකාර ලැබීමෙන් අනතුරුව ඇයට යළි දෙපයින් නැගිටීමේ අවස්ථාව සැලසුනේ ඇගේ ජීවිතයේ එතෙක් දස වසකට ආසන්න කාලයක් රෝද පුටුවකට සීමාවී තිබූ යුගය සදහටම අවසන් කරමිනි.



තම ජීවිතය යළි ලබාදීම පිළිබඳ ඇය යුද්ධ හමුදාවට සිය සතුට හා ස්තුතිය පුදකරනුයේ හෘදයාංගමවය. ඇයගේ එම අව්‍යාජ සතුට ප්‍රකාශ කරනු වස් තම අත්අකුරින් යුද හමුදා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයට ඇය ලිපියක් එවීමට කටයුතු කළාය. යුද හමුදාවේ කාර්යභාරය යුද්ධයක් පැවතියද නැතුවද ජනතා සුබසෙත, ර. කවරණය පිණිසම බවට ඇයගේ මෙම ලිපිය තුළින්ද තවදුරටත් පසක් කරයි.






## විරු දිරියෙන් ඉගෙනුමට අත්වැලක්




2(සේව) ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට අයත් සෙ/එල්00833 මාණ්ඩලික සැරයන් ජයවීර ඒඑල්ඒ 2021.08.30 වන දින යුද හමුදාවෙන් විශ්‍රාම ලැබූ අයෙකි. ඔහු සිය හමුදා සේවා කාලය වෙනුවෙන් විශ්‍රාම පාරිතෝෂිත ලෙස ලද රුපියල් 425,000.00 ක මුදලක් වැයකොට තමන් අධ්‍යාපනය ලැබූ ර/දොඩම්පෙ ශ්‍රී රාහුල මහ විද්‍යාලයටත් දොඩම්පෙ කණිෂ්ඨ විද්‍යාලයටත් සුහුරු පන්ති කාමරයකට (Digital Smart Class Room) අවැසි උපකරණ ලබාදීමට ක්‍රියාකොට ඇත.

එම සුහුරු පන්ති කාමරය පසුගිය ජුනි 19 වන දින ඔහු විසින් සිසු අයිතියට පවරාදෙන ලදී. රණවිරුවකු ලෙස ඔහු විසින් සිදුකළ එම සත්කාරය හරහා පොදු ජනතාව තුළ හමුදා විරුවන් පිළිබඳ ඇතිවන්නේ යහපත් ආකල්පයකි. ඔහුගේ එම සත්ක්‍රියාවට උපහාර පිණිස රණවිරුවා හි මෙසේ සටහන් තබන්නෙමු.





## පාසල් උපකරණ බෙදාදීමක්

ගල්ලෑව ප්‍රාථමික විද්‍යාලයේ සහ සියඹලෑව ප්‍රාථමික විද්‍යාලයේ සිසු දරුවන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 25 වන දින 1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භටපිරිස් හි සංවිධායකත්වයෙන් පවත්වනු ලැබූහ.

## අභිමානවත් 26 වන සංවත්සර දිනය සමරයි





22 වන පාබල සේනාංකයේ 26 වන සංවත්සර දිනය ඉකුත් ජූලි 23 වන දින යෙදී තිබූ අතර, ඒ වෙනුවෙන් වැඩසටහන් මාලාවක් සංවිධානය කර තිබුණි.

ඒ අතර සේනාංක, බලසේනා සහ ඒකක අතර පැවති අභියෝගතා ක්‍රිකට් තරගාවලිය, කරුණා නිවස වැඩිහිටි නිවාසයේ ශ්‍රමදානය, රේවත ළමා නිවාසය වෙත දිවා ආහාරය හා ත්‍යාග පාර්සල් පිරිනැමීම, සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාව, සේනාංකාධිපති වෙනුවෙන් පැවති සම්මාන මුරය සංවත්සර වැඩසටහන් අතර කැපී පෙනුනි. උත්සව මාලාවේ අවසන් අංගය ලෙස සියලු නිලයන් සඳහා සංගීත ප්‍රසංගයක් සංවිධානය කර තිබූ අතර, ඒම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපතිද සහභාගී විය.

## සහෝදරත්වය වර්ධනය කිරීමේ අරමුණින් වොලිබෝල් තරඟාවලියක්





68 වන පාබල සේනාංකය යටතේ ඇති පාබල බලසේනා සහ ඒකක අතර සුහදත්වය වර්ධනය කිරීම සහ සෙබළුන්ගේ ක්‍රීඩාශීලීත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අභියෝග කුසලාන ශූරතා වොලිබෝල් තරගාවලියක් ඉකුත් ජූලි 29 වන දින මුල්ලිවයික්කාල් වෙරළ තීරයේදී පැවැත්විණ. 682 වන පාබල බලසේනාව විසින් සංවිධානය කරනු ලැබූ මෙම තරගාවලිය සඳහා 681 සහ 682 වන පාබල බලසේනා, 6 වන ගැමුණු හේවා බලඇණිය, 3(සෙව) බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුව, 6 සහ 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු කණ්ඩායම් සහභාගී වූ අතර, අවසන් මහා තරගයේදී 3(සෙව) බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තු කණ්ඩායම පරදවා 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු කණ්ඩායම ශූරතාවය දිනාගන්නා ලදී. මෙම තරගාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය.

# දිවංගත ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව යුද සෙන්පති අනුස්මරණය කෙරේ

ජාතියේ ආරක්‍ෂාව වෙනුවෙන් කළ දායකත්වය සහ ස්වෛරීභාවය ආරක්‍ෂා කිරීම සඳහා වූ නොසැලෙන කැපවීම වෙනුවෙන් ගෞරවාදරයට පාත්‍ර වූ දිවංගත ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව යුද සෙන්පති සුවිශේෂී චරිතයකි. එතුමාගේ 31 වැනි ගුණ සමරුව නිමිත්තෙන් ඉකුත් අගෝස්තු 08 වන දින 24 වන පාබල සේනාංක මූලස්ථානයේදී එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් චන්ද්‍රසිරි ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පුණ්‍යානුමෝදනා පිංකමක් පවත්වනු ලැබීය. මෙම අවස්ථාව සඳහා සේනාංකයට අයත් නිලධාරීන් සෙසුනිලයින් 200 ක පමණ පිරිසක් සහභාගී වූහ.





# උසස් පාබල කණ්ඩායම් පුහුණු පාඨමාලාව අංක 04 ඇරඹේ

උසස් පාබල කණ්ඩායම් පුහුණු පාඨමාලා අංක 04 පසුගියදා ආධුනික පුහුණු මධ්‍යස්ථානය - දියතලාවෙහි ආරම්භ කරන ලදී. 1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් පරිදි 58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ටීඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ ආරම්භ කෙරුණු මෙම පාඨමාලාවේ ආරම්භක දේශනය 582 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්සී අබේකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් පවත්වන ලදී. ගැමුණු හේවා බලඇණියේ නිලධාරීන් 06 දෙනකු සහ සෙසුනිලයින් 221 දෙනකු මෙම පාඨමාලාව සඳහා සහභාගී වූහ.





## 242 වන පාබල බලසේනාධිපති ඒකක සංචාරයක



242 පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් කේපීඑල් අමුණුපුරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඉකුත් ජූලි 27 වන දින කන්චිරන්කුඩා ප්‍රදේශයෙහි ස්ථාපිත 8 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සංචාරයක නිරතවිය. ඒකක අණදෙන නිලධාරී විසින් බලසේනාධිපති උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව තම ඒකක බලප්‍රදේශය පිළිබඳව, හටපිරිස් යෙදවීම සහ අනෙකුත් වැදගත් කරුණු පිළිබඳව බලසේනාධිපති දැනුවත් කරන ලදී. මෙහිදී, බලසේනාධිපති එම හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.



## සුහදත්වය වර්ධනයට ක්‍රිකට් තරඟාවලියක්





52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් වයිඑබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ මගපෙන්වීම යටතේ 523 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ උපදෙස් මත දමිළ ජනතාව හා යුද්ධ හමුදාව අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් යුතුව ජේ/295 නාවට්කුලි (නැ) ග්‍රාමසේවා වසමෙහි තරුණයින් හා 11 ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ හටපිරිස් සමග සුහද ක්‍රිකට් තරගාවලියක් ඉකුත් අගෝස්තු 06 වන දින පවත්වනු ලැබීය. එහිදී, තරගාවලියේ ජයග්‍රහණය නාවට්කුලි (නැ) ග්‍රාමසේවා වසමෙහි තරුණයින් විසින් හිමිකරගනු ලැබීය.

## අභිමානවත් 12 වන සංවත්සරය සමරමින්





අභිමංසල 1 සුවසහන නිකේතනය ඉකුත් ජූලි 26 වන දින 12 වන සංවත්සර දිනය අභිමානවත් අයුරින් සමරන ලදී. එහිදී, සේනාවිධායක හට කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, රුක් රෝපණය සිදුකිරීම, හටපිරිස් ඇමතීම, පුනරුත්ථාපනලාභීන් සහ කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් දිවා භෝජන සංග්‍රහයක් සහ එදින සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පවත්වන ලදී. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති, 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, අභිමංසල 1 සුවසහන නිකේතනයේ සේනාවිධායක ඇතුළු රණක්ෂිතයට පත් පුනරුත්ථාපනලාභීන්, කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

## ඉගෙනුමට අත්වැලක්



17 වන ගැමුණු හේවා බලකාය විසින් යාපනය ගුරුනගර් බටහිර ප්‍රජා මධ්‍යස්ථාන පෙරපාසලේ ඉගෙනුම ලබන අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන් 60 දෙනකු සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 20 වන දින පැවැත්විණ. 512 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් එල්ජීජේඑන් ආරියතිලක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවට 17 වන ගැමුණු හේවා බලකායේ නිලධාරීන් සහ සෙසුනිලයින්, පෙරපාසල් ගුරු මණ්ඩලය, දරුදැරියන් සහ ඔවුන්ගේ දෙමව්පියන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

## හදිසි ගින්න මැඩ පැවැත්වීමට යුද්ධ හමුදා සහාය



යාපනය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කිලිනොච්චි අරවියල්නගර් පිහිටා ඇති විශ්වවිද්‍යාල භූමිය තුළ ඉකුත් අගෝස්තු 04 වන දින ගින්නක් ඇතිවිය. ඉතා දැඩි ලෙස පැතිරුනු ගින්න මැඩ පැවැත්වීම සඳහා 9 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ භටපිරිස් කිලිනොච්චි නගර සභාවේ ගිනිනිවන ඒකකය සමඟ එක්ව කටයුතු කරන ලදී.

## පූර්ව මුඛ පිළිකා දන්ත වෛද්‍ය සායන වැඩසටහනක්





අම්පාර සෞඛ්‍ය නිලධාරි කාර්යාලය වෙතින් සංවිධානය කරන ලද පූර්ව මුඛ පිළිකා දන්ත වෛද්‍ය සායන වැඩසටහන ඉකුත් අගෝස්තු 09 වන දින සටන් පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එම පුහුණු පාසල් පරිශ්‍රයේදී පැවැත්විණ. මේ සඳහා 24 වන පාබල සේනාංකය, 241, 242 යන පාබල සේනාංක, 5 වන ගැමුණු හේවා බලකාය, 14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 8, 11 සහ 16 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුලු, දීඝවාපි වැඩ කණ්ඩායම සහ සටන් පුහුණු පාසලෙහි රාජකාරි නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් 300 ක පමණ ප්‍රමාණයක් සහභාගී වූහ. යුද්ධ හමුදාවේ රාජකාරි නියුතු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ මට්ටමකට ගෙනඒම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ විය.

## නවීකරණය වූ යටිතල පහසුකම් සෙසුනිල අයිතියට



යුද්ධ හමුදා පුහුණු පාසල - මාදුරුඔය නිත්‍ය කාර්ය මණ්ඩලයේ සහ පාඨමාලාවන් හැදෑරීම සඳහා රපෝර්තු කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සුභසාධනය උදෙසා භාවිතා කරන ලද තේපැන් හල, රජකසේවා ස්ථානය සහ සෙසුනිල භෝජනාගාරය එම පුහුණු පාසලේ සේනාවිධායක තුමන්ගේ මගපෙන්වීම යටතේ නවීකරණය කර ඉකුත් අගෝස්තු 08 වන දිනට යෙදුණු සුබ මොහොතින් විවෘත කරන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා පුහුණු පාසල - මාදුරුඔය සේනාවිධායක බ්‍රිගේඩියර් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී එක්වූවේය.

# ඉගෙනුමට අත්වැලක්





211 වන පාබල බලසේනා බලප්‍රදේශයේ පදවිය අ/කුඩාරත්මලේ, වැළිඔය මු/ජනකපුර සහ මු/හැළඹවැව විද්‍යාලයන්හි පාසල් ළමුන් 132 ක් සඳහා පාසල් පොත් කට්ටල බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු මස 15 වන දින පැවැත්විණ. 21 වන පාබල සේනාංකාධිපති ගේ මගපෙන්වීමෙන් 211 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් අයිඑන් කඳනආරච්චි ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් සිදුකළ මෙම සත්කාර්යයට මහජන බැංකුව පදවිය ශාඛාවේ අනුග්‍රහකත්වය හිමිවිය. මෙම වැඩසටහන 9 සහ 5 (සෙව්) ගජබා රෙජිමේන්තු විසින් සංවිධානය කරන ලදී.

# නව සම්බන්ධීකරණ මූලස්ථාන ගොඩනැගිල්ලක්





ශ්‍රී ලංකා රයිෆල් බලකායේ සහ ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමී බලකායේ සම්බන්ධීකරණ මූලස්ථාන කාර්යාලය ස්ථාපිත කර තිබුණේ 1 ශ්‍රී ලංකා රයිෆල් බලකායට අයත් ගොඩනැගිල්ලකය. ඒ සඳහා එම පරිශ්‍රයේම නවතමයෙන් ඉදිකරන ලද අඩි 100x20 ක ප්‍රමාණයේ පෙරනිමි ගොඩනැගිල්ලක් පසුගිය අගෝස්තු මස 17 වන දින ශ්‍රී ලංකා රයිෆල් බලකායේ සහ ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමී බලකායේ සම්බන්ධීකරණ නිලධාරී කර්නල් ජේකේඑන්එස් ජයසිංහ කේඑස්පී අතින් විවෘත කෙරිණ. එහි ඉදිකිරීම් යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීකේආර් සිල්වා කේඑස්පී ගේ මගපෙන්වීම යටතේ රයිෆල් බලකායේ සහ යුද හමුදා පුරෝගාමී බලකායේ මූල්‍ය හා ශ්‍රමදායකත්වයෙන් සිදුකරන ලදී.

# 16 වන සංවත්සරය අභිමානවත්ව සමරමින්





8 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ 16 වන සංවත්සරය ඉකුත් අගෝස්තු මස 15 වන දින එහි අණදෙන නිලධාරී මේජර් ඊඩීඒස්කේ දෙනියාය ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. එහිදී, හටපිරිස් අතර සහෝදරත්වය වැඩි දියුණු කිරීම සහ වෘත්තීය ඒකාකාරීත්වය මගහරවාලීමේ සාමූහික ක්‍රීඩා උළෙලක් සහ විනෝදාස්වාද වැඩසටහනක් පැවැත්විණ. එම අවස්ථාව සඳහා ඒකක නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# පුනරුත්ථාපනලාභීන්ගේ සුවදුක් විමසමින්





පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එස්සී ඒකනායක ආර්එස්පී පසුගිය ජූලි 28 වන දින අභිමංසල 1 සුවසහන නිකේතනයේ සංචාරයක නිරත විය. එහිදී, රණඝිතයට පත් පුනරුත්ථාපනලාභීන්ගේ සුවදුක් විමසීම, ඔවුන් වෙත තෑගි පාර්සල් බෙදාදීම සහ හටපිරිස් ඇමතීම සිදුකරන ලදී. සංචාරය සඳහා එම සුවසහන නිකේතනයේ සේනාවිධායක ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක්ද එක්වූහ.

# අකුරු කරනට විරු සවියෙන් සෙවණක්





513 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්ආර් රාසික් ආර්එස්පී ගේ මගපෙන්වීම මත පාසල් පන්ති කාමර තුළ පවතින තදබදය අවම කරමින් සිසු සිසුවියන්ගේ අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් යාපනය, වඩ්ඩු කාර්තිකනන්‍ය ප්‍රාථමික විද්‍යාලයේ ඉදිකරන ලද නව පන්ති කාමරය පසුගිය ජූලි මස 17 වන දින විවෘත කෙරිණ. 11 ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී මේජර් කේවීඑස්එස් විතානගේ යූඑස්පී පීඑස්සී ගේ අධීක්ෂණයෙන් එම ඒකක හටපිරිස් එහි ඉදිකිරීම් සිදුකළහ. එම අවස්ථාව සඳහා 513 වන පාබල බලසේනාව, 11 ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස්, වඩ්ඩු කාර්තිකනන්‍ය ප්‍රාථමික විද්‍යාලයේ ගුරු මණ්ඩලය සහ සිසු සිසුවියෝ සහභාගී වූහ.

# සංඥා බලකාධිපති 3 වන සංඥා බලකායේ සංචාරයක



ශ්‍රී ලංකා යුද හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ සිය ධූරයේ වැඩ භාරගැනීමෙන් අනතුරුව පසුගිය අගෝස්තු මස 08 වන දින වාසවිලාන්හි පිහිටි 3 රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ සිය ප්‍රථම සංචාරය සිදුකරන ලදී. එහිදී, එම ඒකකයේ පාලන කටයුතු පිළිබඳ සොයාබැලූ හෙතෙම සංඥා බලකායේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජකාරීන් ඒකාබද්ධවීමත් සමග සංඥා ඒකකයේ නවමු කාර්යභාරයන් උසස් මට්ටමින් ඉටුකිරීම පිළිබඳ දැනුවත් කරමින් හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.







# දිරිය විරිය කාන්තා සෙබළියන් හට කෘෂි හා පශු සම්පත් බලකායෙන් මාහැඟි පරිත්‍යාගයක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් බලකායෙහි සේවය කරමින් එම රෙජිමේන්තුවේ දියුණුව සඳහා වෙහෙස වන්නා වූ දිරිය කාන්තා සෙබළියන් සහ සිවිල් සේවක මහත්ම මහත්මීන් 275 දෙනකු සඳහා වියළි සලාක මලු ප්‍රදානය කිරීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අගෝස්තු 23 වන දින පොදු සේවා බලකා ශ්‍රවණාගාරයේදී පවැත්විණ. කෘෂි හා පශු සම්පත් බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී වීඑස්වී යූඑස්පී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකක උප මහජන සම්බන්ධතා නිලධාරිනී මෙන්ම කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මියගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ මෙම මාහැඟි කටයුත්ත ක්‍රියාවට නැංවිණ.



# පාන්ගොල්ල අභිමංසල 3 සුවසහන නිකේතනයේ විරුවන්ගේ සුවදුක් විමසමින්







මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් තම කාය දානය ලබාදී රණඝෂිතයට පත්ව පාන්ගොල්ල අභිමංසල 3 සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන වීරෝදාර රණවිරුවන්ගේ සුවදුක් විමසීමට හා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් පවත්වාගෙන යනු ලබන කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය නිරීක්ෂණය කිරීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය විසින් ඉකුත් අගෝස්තු මස 09 වන දින සංචාරයක නිරත වූවාය.

එහිදී, සභාපතිතුමිය විසින් සුවසහන නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ වාට්ටු වෙත ගොස් සුහද කතාබහක නිරත වූ අතර, ඔවුන්ගේ මානසික ඒකාග්‍රතාවය ඉහළ නැංවීමට හා චිකිත්සක ප්‍රතිකාර පිළිබඳ කරුණු විමසා එහි ප්‍රගතිය සඳහා අවැසි උපදෙස් එහි සේනාවිධායක ඇතුළු කාර්ය මණ්ඩලය වෙත ලබාදුන්නාය.

මෙම සංචාරය සනිටුහන් කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ දායකත්වයෙන් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් ආබාධිත රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදුන් අතර, සුවසහන නිකේතනයේ පරිහරණයට අත්‍යවශ්‍යව තිබූ ජල චිකිත්සාව සඳහා භාවිත කරනු ලබන පිහිණුම් තටාකය නිසි පරිදි නඩත්තු කිරීම සඳහා අවශ්‍ය ජල පිරිපහදු ද්‍රව්‍ය හා උපාංග ප්‍රදානය කෙරිණ.

මෙම සංචරයේදී නේවාසිකව ප්‍රතිකාර ගන්නා රණවිරුවන් විසින් නිර්මාණය කරන ලද නිර්මාණයන් නැරඹීමට මෙන්ම සුවසහන නිකේතනයේ රණවිරුවන් වෙනුවෙන් ඉදිකර ඇති ආයුර්වේද රෝහල නැරඹීම සඳහා ද මෙම ඒකකය අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබන පාන්ගොල්ල කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය නිරීක්ෂණය කිරීම සඳහාද සභාපතිනිය එක්වූවාය.





# “විරැලිය හරසර”

## වැඩසටහන සාර්ථකව අවසන් කෙරේ

යුද්ධ හමුදාධිපතිගේ මාර්ගෝපදේශකත්වයෙන් සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ උපදෙස් මත යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය සහ *CBL* සමූහ ආයතනය එක්ව "විරැලිය හරසර" යන තේමාව පදනම් කරගනිමින් යුද්ධ හමුදාවේ සක්‍රිය සේවයේ නියුතු නිලධාරිනියන්, සෙබළියන් වෙනුවෙන් කෑම පිසීම පිළිබඳ වැඩමුළුවක් ඉකුත් අගෝස්තු 17 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.

එහි ආරම්භය සනිටුහන් කරමින් *CBL* සමූහ ආයතනයේ ක්ලස්ටර් අංශයේ සාමාන්‍යාධිකාරි (අලෙවි) සචි ප්‍රනාන්දු මහත්මිය විසින් මෙම වැඩමුළුවේ වැදගත්කම පෙන්වා දෙන ලදී. ඉන්පසු වැඩසටහන සඳහා සහභාගි වූ යුද්ධ හමුදා නිලධාරිනියන් සහ සෙබළියන් හට *CBL* සමූහ ආයතනයේ ක්ලස්ටර් නිෂ්පාදනයන් අඩංගු වටිනා ත්‍යාග පාර්සල්ද පිරිනැමිණ.

මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය, *CBL* සමූහ ආයතනයේ *FOOD* ක්ලෙස්ටර් අංශයේ සාමාන්‍යාධිකාරි (අලෙවි) ඇතුළු එම ආයතනයේ නිලධාරීන්, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් මෙන්ම රෙජිමේන්තුවලට අයත් නිලධාරිනියන්, සෙබළියන් ඇතුළු යුද්ධ හමුදා සාමාජිකයින් 200 කට අධික පිරිසක් සහභාගී වූහ.



# 61 වන වැඩසටහනට

## යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව දායක වේ







ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව සමග ඒකාබද්ධව "දෙරණ" රූපවාහිනී නාලිකාව මගින් සංවිධානය කරනු ලැබූ "මනුසත් දෙරණ" ප්‍රජා සත්කාරයෙහි 61 වන වැඩසටහන උඩවලව මහා විද්‍යාල පරිශ්‍රයේදී ඉකුත් ජූලි 29 වන දින පැවැත්විණ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මිය සහ "මනුසත් දෙරණ" වැඩසටහනේ සභාපති මහේෂ් ජයවර්ධන මහතා ද සහභාගී වූහ.

එහිදී, ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමය වෙතින් නොමිලේ අක්ෂි පරීක්ෂාවන් සිදුකර ඇස් කණ්ණාඩි 600 ක් බෙදාදුන් අතර, රාගම ලීසන්ස් රෝහලේ අනුග්‍රාහකත්වයෙන් වකුගඩු රෝග මුල් අවධීන් හඳුනාගැනීම සඳහා පරීක්ෂණ 800 ක් සහ කොලෙස්ට්‍රෝල් අවධානම හඳුනාගැනීම සඳහා වෛද්‍ය පරීක්ෂණ 150 ක්ද සිදුකරනු ලැබීය.





මෙම වැඩසටහනට සමගාමීව *Aqua Light* සමාගම වෙතින් උඩවලව මධ්‍ය මහා විද්‍යාලයට ජල පිරිපහදු යන්ත්‍රයක්, පොල් වගා කිරීමේ මණ්ඩලය වෙතින් දෙමුහුන් පොල් පැළ 500 ක්, ප්‍රදේශයේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් "මනුසත් දෙරණ" වැඩසටහන යටතේ අත්වාරු 05 ක් සහ සැරයටි 05 ක් පරිත්‍යාග කිරීමද සිදුවිය.

ප්‍රදේශයේ විදුලිය නොමැති නිවාස වෙත *Octan* පුද්ගලික සමාගම විසින් සූර්ය බලශක්ති පද්ධති 03 ක් සහ වගා කටයුතු සිදුකරනු ලබන අවශ්‍යතා සහිත පවුල් වෙනුවෙන් කෘමිනාශක ඉසින යන්ත්‍ර 04 ක් පරිත්‍යාග කිරීමද *Kyodai Lanka Pvt Ltd* සමාගම වෙතින් ප්‍රදේශයේ තරුණ තරුණියන් 100 දෙනකු වෙනුවෙන් ජපානයේ රැකියා සඳහා යෙදවීමට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද යුද්ධ හමුදා සාමාජිකයින් 80 දෙනකුගේ සහභාගීත්වයෙන් රුධිර පරිත්‍යාග වැඩසටහනක් ද එහිදී පැවැත්විණ.

තවද, එම වැඩසටහන සමාප්තියෙන් පසුව, ආරාධිතයෝ උඩවලව, තිබෝල්කැටිය ප්‍රදේශයේ වෙසෙන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ විශ්‍රාමික කොමිෂන් නොලත් නිලධාරියකු වෙනුවෙන් ඉදිකළ නිවසක් විවෘත කිරීමේ අවස්ථාවකටද සහභාගී වූහ. රෝගී තත්ත්වයක් හේතුවෙන් විශ්‍රාම ගැන්වූ එම යුද්ධ හමුදා සාමාජිකයා එක්දරු පියෙකු වන අතර ඔහු මේ වනවිට එක්තැන්ව සිටියි. ඔහුගේ භාර්යාව ද රැකියාවක් නොකරන අතර ඔවුන් වෙත මෙම නව නිවස ප්‍රදානය කිරීමට ප්‍රථම කටුමැටි නිවසක ජීවත්විය.



කොම්පසද්සදවීදිය ප්‍රදේශයේ පිහිටි *Amila Tyres Pvt Ltd* සමාගම සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව ඒකාබද්ධව මෙම නව නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදුන් අතර ඒ වෙනුවෙන් අවශ්‍ය තාක්ෂණික දැනුම සහ ශ්‍රම දායකත්වය ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා මූලික වැඩපළේ භටපිරිස් ලබාදුන්හ.

මෙම අවස්ථාවන් සඳහා යුද්ධ හමුදා හටකාර්ය සම්පාදක අණසක ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු නිලධාරීන්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, සෙසුනිලයන්, උඩවලව මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති, ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රදේශවාසීහු විශාල පිරිසක් සහභාගී වූහ.

# "සෙනෙහසේ කැදැල්ල"

## සෞන්දර්යාත්මක සැඳෑව















යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය සහ "දෙරණ" මාධ්‍ය ජාලය එක්ව යුද්ධ හමුදා කාන්තා නිලධාරිනියන් සහ සෙබළියන් වෙනුවෙන් සංවිධානය කළ " සෙනෙහසේ කැදැල්ල" සංගීතමය වැඩසටහන ප්‍රවීණ ගීත රචක ධම්මික බණ්ඩාර මහතාගේ සම්පත් දායකත්වයෙන් ඉකුත් ජූලි 28 වන දින පනාගොඩදී පවත්වනු ලැබීය.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවට එහි සාමාජිකාවෝ රැසක්ද, යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් කාන්තා නිලධාරිනියන් සහ කාන්තා සෙබළියෝ 800 කට අධික පිරිසක්ද එක්ව සිටියහ.

ගීත රචක ධම්මික බණ්ඩාර මහතා විසින් එහිදී මියුරු ගීත සමූහයක් තෝරාගෙන එම ගීතවල අර්ථය, ජීවිතයේ එදිනෙදා කටයුතු සඳහා සාහිත්‍යයේ ඇති වටිනාකම, ආදරය හා සෙනෙහස, මාතෘත්වය ආදී කරුණු ගෙනහැර දක්වමින් එම ගීත නිර්මාණය වීමට මුල්වූ හේතු විස්තරාත්මකව පැහැදිළි කළේය.

මෙම අවස්ථාවට ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ හිමාලි පුස්සැල්ල මහත්මිය ඇතුළු පිරිසක්ද එක්වූහ.



# සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ මහා සභා රැස්වීම





සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ මාසික සභා රැස්වීම එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නාලනී රත්නායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි 22 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේදී පැවැත්විණ. එහිදී, සේවා වනිතා ශාඛාව මඟින් සිදුකිරීමට අපේක්ෂිත ඉදිරි වැඩසටහන් පිළිබඳව සාකච්ඡා කෙරුණු අතර, සෙසුනිලයින් 14 දෙනකුට හට පොලී රහිත ණය පහසුකම් යටතේ ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ලබාදෙන රුපියල් 100,000.00 ක ණය මුදල් ප්‍රදානය කිරීමද සිදුවිය.

# ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් රණවිරු අනුස්මරණ වැඩසටහනක්





ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරී වෙලගෙදර මහත්මියගේ අදහසකට අනුව එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් ගැමුණු හේවා බලකායට අයත් ක්‍රියාන්විතයේදී මියගිය සහ අතුරුදන් වූ රණවිරුවන් අනුස්මරණය කිරීම ඉකුත් ජූලි 29 වන දින මයිලපිටියේ පිහිටි රණවිරු ස්මාරකය අභියසදී පැවැත්විණ. එම අවස්ථාව සඳහා මියගිය/අතුරුදන් රණවිරුවන් 31 දෙනකුගේ භාර්යාවන් හා දූ දරුවන්ද සහභාගී වූ අතර, ඔවුනට සිහිවටන ඡායාරූප ලබාදීමද එහිදී සිදුකෙරිණ.

# සේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාග රැසක්



6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ රාජකාරී නියුතු රණවිරුවන්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ පවුල් සඳහා වියලි සලාක ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීම සහ ඔවුන්ගේ පවුල්වල අධ්‍යාපනය හදාරන දූ දරුවන් උදෙසා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු 12 වන දින එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මියගේ ගේ ප්‍රධානත්වයෙන් උතුරු පලාත් සභා ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.

# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවෙන් කැඳ හලක් ආරම්භ කෙරේ





වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වෛද්‍ය ඒ නිල්මිණි ප්‍රනාන්දු මහත්මියගේ අදහසකට අනුව නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් වෙනුවෙන් කුරක්කන් පිටි කැඳ හා කොළ කැඳ ලබාදීමේ අරමුණින් ඉකුත් ජූලි 31 වන දින 1 වන වෛද්‍ය බලකා ජන අවන්හල පරිශ්‍රයේදී කැඳ හලක් විවෘත කරන ලදී. මෙම අවස්ථාවට වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය, එම බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩ්බ්ලිව්ඩ්බ්ලිව්යුඑස් වනසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී ඇතුළු එම බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි කටයුත්තක්






යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ මගපෙන්වීම මත 7 වන යුධෝපකරණ බලකාය වෙතින් මුලතිව් ප්‍රදේශයේ පිහිටි "භාරතී" ළමා නිවාසය වෙත දිවා ආහාර වේලක් සහ ත්‍යාග පාර්සල් පිරිනැමීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු 13 වන දින සිදුකරන ලදී.

# පොලිස් සේවා බලකා සේවා වනිතා ශාඛාවේ මාසික සභා රැස්වීම





යුද්ධ හමුදා පොලිස් සේවා බලකා සේවා වනිතා ශාඛාවේ මාසික සභා රැස්වීම ඉකුත් අගෝස්තු 23 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේදී පැවැත්විණ. එම රැස්වීමෙන් අනතුරුව හසිත්ත හේවාවසම් මහතා විසින් මනෝවිද්‍යාත්මක හා මානසික සෞඛ්‍ය සම්බන්ධව දේශනයක් ද සිදුකළ අතර, ඒ සඳහා එම බලකා සේවා වනිතා සාමාජිකාවෝ සමගින් නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයෝ 200 කට ආසන්න පිරිසක් සහභාගී වූහ.

# පුනරුත්ථාපනලාභීන්ගේ සුවදුක් විමසමින්





බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා සේවාවනිතා ශාඛාවේ සභාපතිනිය ඇතුළු එම ශාඛාවේ සාමාජිකාවෝ ඉකුත් අගෝස්තු 07 වන දින පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන "රණවිරු සෙවණ" පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සංචාරයක නිරත වූහ. එහිදී, රණක්ෂිතයට පත් පුනරුත්ථාපනලාභීන්ගේ සුවදුක් විමසීම, බෝධිපූජා වැඩසටහනක් පැවැත්වීම හා ඔවුන් හට තෑගි පාර්සල් බෙදාදීම ද සිදුකෙරිණ. එම අවස්ථාව සඳහා පුනරුත්ථාපන අධ්‍යක්ෂ, "රණවිරු සෙවණ" පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සේනාවිධායක ඇතුළු කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක්ද සහභාගී වූහ.

# යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවෙන් එක්දින වැඩමුළුවක්








ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී හා එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශ්‍යාමලී විජේසේකර මහත්මියගේ මඟපෙන්වීම මත එම රෙජිමේන්තුවට අයත් සියලු නිලයින් සඳහා එක්දින වැඩමුළුවක් ඉකුත් අගෝස්තු 22 වන දින බොරැල්ලේ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.

එහිදී, ගල්කිස්ස හෝටලයේ සූපවේදී සහ ප්‍රවර්ධන කටයුතු අධ්‍යක්ෂ දේශබන්දු ආචාර්ය පබ්ලිස් සිල්වා මහතා විසින් රාජකාරීහි නිරත සෑම පුද්ගලයකුම යහපත් හා නිරෝගිමත් ශරීරයකින් යුතුවීම සහ විවිධ අසමතුලිත ආහාර රටාවන් නිසා ඇතිවන ලෙඩරෝගවලින් වැළකී නිරෝගිමත් දිවි පෙවෙතක් ගතකිරීමට අවැසි ආහාර වට්ටෝරු පිළිබඳ හරවත් දේශනයක් සිදුකරන ලදී. තවද, ප්‍රවීණ කේක් නිර්මාණ ශිල්පිණී නිමාකෝ ද සිල්වා විසින් සිදුකළ කේක් නිර්මාණ හා සැරසුම් පිළිබඳ ඉතා වැදගත් දේශනයක්ද "2nd *Chance Flowers*" හි අධිපති ප්‍රවීණ මල් සැකසුම් නිර්මාණ ශිල්පී සුමින්ද පෙරේරා මහත්මා විසින් සිදුකළ කේක් මල් සැකසුම් නිර්මාණය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ දේශයක්ද මෙම එක්දින වැඩමුළුවට ඇතුළත් විය.




## කෙටිකතාව

# වීර පදුස්තම

ඩෝං යන හඬින් පොළවට පතිත වන අග්නි සැරවත් ගුවන් බෝම්බ ප්‍රහාරවලින් සාන්ත හෙලේනා දූපත හෙල්ලුම් කා ගියේ නිමේෂයකිනි. අවට ගහකොළද, සතා සිවුපාවා ද දූවිල්ලෙන් වැසී යද්දී අහස පුරා පැතිරිගිය කළු දුමාරය අතුරින් කාක් රැනක් සේ පියාසර කරන ගුවන්යානා සමූහය පොඩි සිංඤෝ ගේ ඇස ගැසුනේ මුහුදු වෙරළට යාබද පොල් රුප්පාවක බිම වැතිරී සිටිය දීය. ගුවන්යානා සමූහය පියාසර කරන විට නැගෙන භයංකර දෝංකාරයත්, හදිසි අවස්ථාවල නගන සයිරන් නලා හඬත් හැරුණු විට අනෙකුත් සියලු ශබ්ද වහං වී ඇත. මිත්‍ර පාක්ෂික හමුදාවන්ගේ ප්‍රතිප්‍රහාර හමුවේ ආක්‍රමණකාරී ජපන් සේනාංකවලට අයත් ගුවන් යානා පෙළ මොහොතකින් ඈත ක්ෂිතිජ ඉමෙන් නොපෙනී යද්දී උන් තැනම ඇණ තියාගත් පොඩි සිංඤෝ බඳ පටියට අමුණා තිබූ වතුර බෝතලය අතට හලාගනිමින් දූවිලි බැඳුණු ඇස් සෝදන්නට විය. ගතවූයේ තත්පර ගණනක් පමණි. අසල පොල් රුප්පාවල කරටි බිඳදමමින් එතරම් විශාල නොවූ ප්‍රහාරක ජෙට් යානාවක් වෙරළ තීරයට නුදුරු මහ මුහුදට කඩා වැටුණේ පොඩි සිංඤෝගේ දෑස් ඉදිරිපිටදීමය.

"සාන්ත හේලේනා" දූපතේ නොගැඹුරු මුහුදු තීරයට කඩා වැටුණු ජෙට් යානයෙන් කොටසක් වතුරෙන් උඩට ඉලිප්පී පෙනෙන්නට වූ අතර, වෙරළ තීරය දිගට උප්පත් වැසියෝද, කුඩා දරුවෝද, විසිපහක් තිහක් පමණ නොගැඹුරු ජලයේ බැස ඒ දෙස බලා සිටියේ අදහාගත නොහැකි තිගැස්මෙනි.

මුහුදට කඩා වැටුණු ජෙට් යානයෙන් මිදුණු ජපන් උපදෙවයකින් තොරව ජලයේ බැස වෙරළ දෙසට එනවිට පොඩි සිංඤෝ රයිෆලයට උණ්ඩ පුරවාගෙන වෙරළ තීරයේ වූ කුඩා පඳුරක් ආවරණයට ගෙන සූදානම් වූයේ අසරණ වුවත් සතුරන් ගැන

පූර්ණ විශ්වාසයක් තැබිය නොහැකි නිසාවෙනි. ඒ වනවිට ගුවන් නියමුවා හා වෙරළ තීරයේ සිට දූපත් වැසියනුත් අතර විශාල පරතරයක් නොතිබුණු අතර, ගුවන් නියමුවා දෑතේ තිබූ බෝම්බ දෙකක් දූපත් වැසියන්ට එල්ල කිරීමට සැරසෙන අයුරු පැහැදිලිව දුටු පොඩි සිංඤෝ ක්ෂණිකව ක්‍රියාත්මක වී වෙඩිවරුසාවක් ජපනා වෙත මුදාහැරියේ වෙනත් කළයුතු කිසිවක් ඉතිරිව නොතිබුණු අවස්ථාවකදීය. කුමක් සිදුවූයේ දැයි වටහා ගැනීමට අසමත් වූ දූපත් වැසියෝද, කුඩා දරුවන්ද, කෑ ගසමින් වෙරළ තීරය දිගේ දිව යද්දී ගුවන් නියමුවා නොගැඹුරු ජලයේ ඇද වැටුණේය.

එදින රාත්‍රියේ "බංගායි" කඳවුරේ බොහෝ දෙනෙක් පොඩි සිංඤෝ වෙත සුබ පැතුම් පිරිනැමුවේ අවස්ථානෝචිතව ක්‍රියාකර සිදුවන්නට ගිය මහා විනාශයක් බේරාගැනීම පිළිබඳවමය. ඒ අතර, උසස් නිලධාරීහු ද වූහ. සමහරු යුද්ධයේදී ජපනුන්ගේ ම්ලේච්ඡ ක්‍රියා ගැන කතා කළහ. සමහරු යුද්ධයේදී ජපනුන්ගේ වීරක්‍රියා ගැන කතා කළෝය. පර්ල් වරායේ සටනත් බෝම්බ බැඳගෙන ගුවනේ සිට නාවික යාත්‍රාවල කුඹ ගසට පැන නැව් විනාශ කළ ජපනුන් ගැන කතා කළෝය. මේ සියල්ල මැද පොඩි සිංඤෝ ට නම් මතක් වූයේ බිරිඳ හා දරු දෙදෙනාය. වසර කිහිපයක් ගතවූවද ඔවුන් ගැන තොරතුරක් දැන ගන්නට ලැබුණේ ඉඳහිටය.

බිහිසුණු යුද්ධයක් මැද වුවද පසුවදා "බංගායි" කඳවුර තුළ උත්සවයක අසිරිය ගෙන දුන්නේය. විදේශීය ස්වේච්ඡා සංවිධානයක දූත පිරිසක් මිත්‍ර පාක්ෂික හමුදා සෙබළුන් දිරිගැන්වීම මේ කඳවුරු සංචාරය කිරීමට පැමිණ සිටියහ. මොවුන්ගෙන් වැඩි පිරිසක් කාන්තාවෝය. ඔවුහු සෙබළුන් ළඟ ගැවසෙමින් ඔවුන් ගේ සුවදුක් විචාළෝය. ඒ අතුරින් සුරූපී කාන්තාවක් "පොඩි සිංඤෝ... පොඩි සිංඤෝ" යනුවෙන් නුපුරුදු ලෙස උච්චාරණය කරන්නට විය. පොඩි සිංඤෝ ඇය අසලට ගියේය. "ඔබද සිලෝන් ඉඳලා ආව පොඩි සිංඤෝ" ඇය විනීත ලෙස ඇසුවාය.

"ඔව්"

"ඔබද ඒ වීර ක්‍රියාව කළ සෙබලා"

"ඔව්"

"ඔබ කොයි අතින් වෙඩි තියලද සතුරා මැරුවේ?"

මොහොතකින් කුඩා රතු මල් කලඹක් පොඩි සිංඤෝ වෙත පිරිනැමූ සුරූපිනිය ඔහු ඉදිරිපිට දණගසා පොඩි සිංඤෝ ගේ දකුණු අත තම මුවට තබා ආදරයෙන් සිපගත්තේය. ඇයගේ මෙම කෘතවේදී ක්‍රියාව පොඩි සිංඤෝ තරමක අපහසුවෙන් ඉවසා සිටිය ද ඇය නික්මගිය පසු පිටුපසින් ඇසුණේ කොක්හඬලා සිනාසෙන සෙබළ පිරිසකි.

"මොකද අර ගෑණි උඹේ අත ඉඹ්බේ" ඔවුන් විමසා සිටියේය.

"මොන අතින්ද සතුරට වෙඩි තියලා මැරුවේ ඇහුවා මම මේ දකුණු අත පෙන්නුවා"

"මෝඩයා... උඹට කියන්න තිබුණේ කටින් හපලයි සතුරව මැරුවේ කියලා" මහ හඬින් යළිත් සිනාසෙන්නට විය.

තවත් වෙහෙසකර දින කිහිපයක් ගෙවී ගියේය. එක් දිනක උදෑසන "බංගායි" කඳවුරේ කලබලකාරී ස්වරූපයක් ගත්තේය. සමහරු හමුදා පණිවුඩ ගුවන් විදුලි ජාලයට උනන්දුවෙන් සවන්දුන් අතර, තවත් සමහරු රෝඩියෝ යන්ත්‍ර අසල ගැවසුනහ.

"ජපනා ඉවරයි... යුද්දෙ ඉවරයි... හිරෝෂිමා නාගසාකි වලට පරමාණු බෝම්බ දාලා... රටම විනාශලු". සැම තැනින්ම මේ ප්‍රවෘත්තිය කුමක් සිදුවන්නේ දැයි පොඩි සිංඤෝට ඒ හැටි තේරුමක් නොවීය. " මොනවාවෙලා හරි කමක් නැහැ. ගෙදර යන්න තිබ්බනම්" ඔහු නිතර සිහිපත් කළේ බිරිඳ හා දරුවන්ය.

බිහිසුණු යුද්ධයේ ක්‍රියාකාරී ස්වරූපය කෙමෙන් මැකී යද්දී තවත් දින කිහිපයක් ගෙවී ගියේය. එක් උදෑසනක ලද උපදෙස් පරිදි සියලු මිත්‍ර පාක්ෂික හමුදා භටයෝ ද නිලධාරීහුද ශාන්ත හේලේනා දූපතේ වියුනික් චතුරස්‍රයේ සම්මාන ඇඳුමින් සැරසී සිටියේ ප්‍රධාන ආරාධිතයා සැපත්වන තුරුය. තවත් නිමේෂයකින් අශ්වයින් බැඳි පැමිණ සම්මාන පීඨිකාවට අවතීර්ණ වූ කලාපීය අණදෙන නිලධාරී තැන්පත් යුරෝපීය හමුදා නිලධාරියා ආසියාතික භටයින්ගේ උත්තමාචාරය පිරිනැමීමෙන් පසුව ඔහු පෙළපාළිය ඇමතීය.

හිට්ලර් වැනි ලේ පිපාසිතයින්ගෙන් ලෝකය ආරක්ෂා කරගත යුතු යැයි පැවසූ හෙතෙම ජපානය අත්වින්දේ ඔවුන්ගේම ක්‍රියාවල ප්‍රතිඵලය යැයි ද පැවසීය. යුද්ධයේදී මියගිය මිත්‍ර පාක්ෂික භටයින් පිළිබඳව ශෝකය පලකළ හෙතෙම පෙරදිග රටවලින් පැමිණි භටයින්ද තම ස්තුතිය පුද කිරීමට ද අමතක නොකළේය. අනතුරුව එළඹියේ සම්මාන පදක්කම් පිරිනැමීමේ අවස්ථාවයි. එදින පිරිනැමූ සම්මාන අතුරින් උසස්ම සම්මානය වූ "වික්ටෝරියා" මහ රැජිනගේ උඩුකයේ රූපයකින් අලංකාර ලෙස නිර්මාණය කර තිබූ ගෞරවාන්විත වීර සම්මානය ලැබුණේ ඉන්දියන් භටයින් දෙදෙනකුට හා පොඩි සිංඤෝට පමණි. එම සම්මානය ලබාගැනීම සඳහා දහස් සංඛ්‍යාත සෙබළ පිරිස් මැද පොඩිසිංඤෝ ගේ නම අඬගසන විට ඔහුවද ඇඟිමට පවා බැරිවිය.

පසුදින සියළු භටයින් තම ගම් රටවල් බලායාමට ගුවන් යානාවල පටවනු ලැබීය. ලාංකිකයෝ දස දෙනකුද, මැරුටියෝ ඇතුළු ඉන්දියානුවන් 40 ක් පමණ ඉන්දියාවට ගෙනඑනු ලැබීය. ඉන්දියාවේ යටත් විජිත ලේකම් කාර්යාලයේදී ඔවුන් උණුසුම් ලෙස පිළිගනු ලැබුවේ යුරෝපීය නිලධාරීන් පිරිසක් විසිනි. එදින රාත්‍රියේ යටත් විජිතභාර උප ලේකම් මූලාදෑණියාගේ අලංකාර වාස භවනේ රාත්‍රී සාදයක් සංවිධානය කර තිබූ අතර, ඒ සඳහා ආරාධනා ලැබුවේ පොඩි සිංඤෝ ඇතුළු රැජිනගේ වීර පදක්කම්ලාභී ඉන්දියන් භටයින් දෙදෙනා පමණකි. සාදය ඉතා අලංකාර විය. යටත් විජිත උප ලේකම් තැන හා ඔහුගේ භාර්යාව ද තවත් නිලධාරීහු කීපදෙනකුද එහි විය. උස මහත තරබාරු සිරුරක් ඇති ආඩම්බරකාර උප ලේකම් තැන වික්ටෝරියා රැජිනගේ වීර සම්මාන පදක්කම දෑතින් අල්ලාගෙන රැජිනගේ ඔටුන්නේ නිරූපිත එක් එක් වර්ගයේ මැණික් ගල් පිළිබඳ මහ විස්තරයක් කියා දුන්නේ ඒ පිළිබඳ ඔහු තුළ පැවති විශ්මිත දැනුම ප්‍රදර්ශනය කරන නිසාවෙනි. පොඩි සිංඤෝ මධුවිත පානය නොකරයි. අනිත් ඉන්දිය භටයින් දෙදෙනා පානය කළේ "රම්" බෝතලයෙන් ස්වල්පයක් පමණි. එහෙත් සෑහෙන පදමට වෙරි වූ උප ලේකම් තැන තව තවත් මධුවිත පානය කළේ ඔහුගේ බිරිඳ "දැන් ඇති" කියමින් මැසිවිලි නගද්දීය.

"අපේ ආණ්ඩුකාර තුමා රැජිනගේ පදක්කම් පවා වෙන රටවල මිනිසුන්ට

පළඳින්න ඉඩ දෙනවා ඒත්, මේ ගාන්ධි මිනිහා කියන කතාවල කිසිම පදනමක් නෑ. මේ මිනිහා මිනිසුන් උසි ගන්නනවා. ගාන්ධි උන්මත්තකයෙක්"

ඉවසාගත බැරිම තැන ඉන්දීය හටයෝ දෙදෙනා ඉවත බලාගෙන දත්මිටි කෑහ. මේ සුද්දා විසින් ගාන්ධිතුමා විවේචනය කිරීම ඔවුහු නොඉවසූහ. පොඩි සිංඤෝට එහි ගානක් නැත. එහෙත් උප ලේකම් තැන විසින් ලංකාව ඉන්දියාවේම කොටසක් ලෙස හැඳින්වීමේදී නම් පොඩි සිංඤෝ සිත තරමක රිදුනි.

පසුදින සවස් භාගයේ ඉන්දියාවේ සිට ගුවන් මඟින් ලංකා හටයින් යුද්ධය අවසානයේ සිය රටට පැමිණෙන විට පිළිගැනීම සඳහා ලාංකීය ආණ්ඩුකාරවරයා වෙනුවෙන් ඔහුගේ ලේකම්වරයකු ද තවත් ප්‍රභූ නිලධාරීන් පිරිසක් හා ප්‍රභූ කාන්තාවෝ පිරිසක්ද රත්මලාන ගුවන් තොටුපළට පැමිණ සිටියෝය. පැමිණි සිටි ප්‍රභූන් අතර, සතුටු සාමීචියේ කෙළවරක් නොවුන අතර, පොඩි සිංඤෝට සිතුණේ ගෙදර යන්න තව තවත් ප්‍රමාද වෙනවා නොවේද කියාය. බොහෝ දෙනා කතාබහ කළේ පොඩි සිංඤෝ හා ඔහුගේ වීර පදක්කම ගැනය. ප්‍රභූ පිරිසේ යුරෝපීය නිලධාරීහූද, කාන්තාවෝද, මහ රැජිනගේ ජීවමාන සංකේතය බඳු මේ වීර පදක්කම ගෙන ඔවුනොවුන්ගේ කබාවල පළඳවා ගනිමින් ද එය කබායට ගැලපෙන ආකාරය ගැන වර්ණනා කරමින්ද, කොක් හඬලමින් ගෙවද්දී බිරිඳත්, දරුවන් ගැන සංශයෙන් සිහිපත් වූ පොඩි සිංඤෝ කඩිනමින් ගාලුපාර දෙසට ගියේ රෑබෝ වීමට පෙර ගෙදර යා ගන්නේ කෙසේදැයි සිතමිනි.

කොළඹින් තරමක් දුරබැහැර පිහිටා තිබූ නිවසට ළංවන විට පොඩි සිංඤෝ කකුල් දෙක පැටළෙන්නට විය. පාඨශාලාවක ගුරු පත්වීමක් ලබාගෙන අසරණ දරුවන්ගේ නෙත් පෑදීමට සිහින මවමින් සිටින අවධියක පෝලිමේ ගොස් ස්වේච්ඡා හමුදාවට බැඳී වසර කිහිපයකින් යුද්ධය සමඟ ලෝකය වටේ කරක් ගැසූ අයුරු ඔහුට සිහිපත් වන්නට විය. බොහෝ කාලයක් ගතවී ගෙදර යන විට දරු දෙදෙනාටත්, බිරිඳටත් ගෙනියන්නේ කුමක් දැයි සිතන විට බිරිඳටත් දරුවන්ටත් පෙන්වීමට සිහින මැවූ වීර පදක්කම ගුවන් තොටුපළේදී ආණ්ඩුකාරවරයාගේ ලේකම් වූ සුද්දාගෙන් ලබානොගත් බව පොඩි සිංඤෝට සිහිපත් වනවිට, ඔහු නිවසේ දොරකඩට පැමිණ අවසන්ය.

"මේ තියෙන්නේ එක පදක්කමට පදක්කම් දෙකක්ම" යැයි කියමින් පොඩි සිංඤෝ කලකට පසු දරු දෙදෙනා බදාගෙන සිපගන්නා විට බිරිඳ ඉකිගසමින් හඬන්නට විය.

"මේ ළමයින්ට ඉස්කෝලේදී කියල තියෙනවා ළඟදී අපිට නිදහස ලැබෙනවා කියල මොකක්ද අනේ මේ නිදහස දෙනවා කියන්නේ?" පොඩි සිංඤෝ දිනක් අසා සිටියේ දරුවන්ද නිතර නිතර මේ ගැන විමසන නිසාවෙනි.

"මටත් ඒ ගැන කියන්න හරියට තේරෙන්නේ නෑ නෝනේ... කෝකටත් මම කඩේ පැත්තෙ ගිහින් රේඩියෝවෙන් වත් මේ ගැන අහල ඇවිත් කියන්නම්"

තේ කඩය අසළ කිහිපදෙනකු උනන්දුවෙන් රේඩියෝවට කන්දෙමින් සිටි අතර, පොඩි සිංඤෝ එක්විය. යථාකාලයේදී ඉන්දියාවට නිදහස ලබාදීමට බ්‍රිතාන්‍යය සැලසුම්කර ඇති බවත්, ඒ අනුව ඉදිරි කාලයේ ලංකාවට ද නිදහස ලැබීමට ඉඩ ඇති බවත්, රේඩියෝවෙන් ප්‍රචාරය කළේය. ජපනාට සිදුවී ඇති බිහිසුණු හානිය යළිත් යුද්ධයක් ඇති නොවීමට ලෝක ජනතාව පෙළගැසෙන ආකාරයත් කියන්නට විය. ලංකාවෙන් මිත්‍රපාක්ෂික හමුදාවල සහයට ගිය ස්වේච්ඡා හටයෝ ආපසු රත්මලාන ගුවන් තොටුපළෙන් දිවයිනට පැමිණි බවත්, ඔවුන් අතර, පොඩි සිංඤෝ නම් වීර හටයා වෙත ප්‍රදානය කර තිබූ රැජිනගේ වීර පදක්කම ආණ්ඩුකාරවරයා වෙත පිරිනැමීම සඳහා ගුවන් තොටුපළේදී ආණ්ඩුකාරතුමාගේ ලේකම්වරයා වෙත පොඩි සිංඤෝ විසින් ගෞරවයෙන් පිරිනමා ඇති බවත්, රේඩියෝවෙන් කියවුණි.

පොඩි සිංඤෝ සෙමින් සෙමින් තම නිවස වෙත පියවර මැන්නේය. සියලු විස්තර සිරියාවතී හට පහදා දුන්නේය. "අපරාදේ නේද පදක්කම?" ඇය මැසිවිලි නැගුවාය.

"කොහොමත් ඒ පදක්කම මට ලැබුණු දා ඉඳලම මට වැඩිය ඒකට ආශා කළේ සුද්දොමයි. උඹලා දීපු දේ ආපසු යනකොට උඹලම අරගෙන පලයල්ලා. ඕක තමයි නෝනේ නිදහස කියන්නේ"



කර්නල් එම්ජීපී පෙරේරා (විශ්‍රාමික)

# ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාව අංක - 67



යුද්ධ හමුදාවෙහි සාමාන්‍ය සෙබළ, ලාන්ස් කෝප්‍රල් සහ කෝප්‍රල් නිලයේ අයවළුන්ගේ උපදේශන හැකියාව වර්ධය කිරීම සඳහා සටන් පුහුණු පාසල - අම්පාර වෙතින් පවත්වන ලද "ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලා අංක 67" ඉකුත් ජූලි 12 වන දින ආරම්භ කර අගෝස්තු 05 වන දින අවසන් කරන ලදී. මෙම පාඨමාලාව සඳහා යුද්ධ හමුදාවේ සියලු රෙජිමේන්තු යටතේ ඇති නිත්‍ය, ස්වේච්ඡා ඒකක වෙතින් සහ පුහුණු පාසල් වෙතින් සිසුසිසුවියන් 166 දෙනක් සහභාගී වූ අතර, මෙම පාඨමාලාවෙහි අවසන් දේශනය එම පුහුණු පාසලෙහි බ්‍රිගෙ 'ඩියර් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් සිදුකරන ලදී. එහිදී, විශිෂ්ට සාමාර්ථයක් ලබාගනිමින් පාඨමාලාවේ ප්‍රථම ස්ථානය 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායට අයත් සෙ/725644 ලා/කෝ අනුෂිකා එච්ටී හිමිකරගන්නාය.

# ඔබේ ආත්ම විශ්වාසය ඔබ ළඟද?

තමා පිළිබඳ තමන් තුළම ගොඩනගාගත් විශ්වාසය නොහොත් ඔබ, මම අපේ හෘද සාක්ෂියට එකඟව කටයුතු කිරීම ආත්ම විශ්වාසයයි. ඔබ තුළ ඔබ පිළිබඳ විශ්වාසයක් නොපවතීනම් ඔබට ඔබේ එදිනෙදා කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා බාධාවක් එක් වෙන්න පුළුවන්. මෙතැන් පටන් ආත්ම විශ්වාසය ගොඩනගා ගන්න පියවර තබමු.

## ඔබ ඔබට ගරු කරන්න....

ඔබට ඔබ ගැන විශ්වාසයක් ඇති කර ගන්න නම් මුලින්ම ඔබ ඔබට ගරු කරන්න. මිනිසුන් වශයෙන් අප තුළ නොපවතින්නේද එයම නොවේද? ඔබේ වටිනාකම්, ඔබේ හැකියාවන්, ඔබේ දුර්වලතා, ඔබේ පෙනුම, ඔබේ අවශ්‍යතා, උවමනා, ඔබේ සබඳතා මේ සෑම දෙයක් තුළින්ම නිර්මාණය වන්නේ ඔබවයි. ස්වරූපයෙන්, සිතුවිලි වලින් යනාදී දහසක් දේ තුළ අපි එකිනෙකාට වෙනස්. අපේ අඩුපාඩු ගැන දුර්වලතා ගැන සිතා, අනෙකාට ඇති ඔබට නැතිදේ ගැන සිතා පසුතැවිලි නොවන්න. ඒ තුළින් හීන වන්නේ ඔබ තුළ ඔබ කෙරෙහි පවතින විශ්වාසයයි. ඔබට නැති දේ ගැන සිතීම නවතා ඔබේ විශේෂත්වය ගැන සිතා ඔබේ ආත්ම විශ්වාසය ගොඩනගා ගන්න.

## ඔබ ඔබම වන්න....

ඔබේ ජීවිතය තුළ සෑමවිටම ඔබ ඔබම වන්න. ඔබ කැමති දේ සිදු කරන්න. තව කෙනෙකුට ඔබේ ජීවිතය ගැන තීන්දු තීරණ ගන්න ඉඩ නොතබන්න. තවත් කෙනෙකුගේ ජීවිතයක් සමඟ ඔබව සංසන්ධනය කර නොගන්න. ඒ තුළින් ගොඩනැගෙන්නේ ඔබේ ආත්ම විශ්වාසයයි.

## සෘණාත්මක අදහස් වලින් බැහැර වන්න....

ඔබේ සෑම කාර්යකදීම ධනාත්මක වන්න. නෑ, බෑ යන සිතුවිලි වලින් ඈත් වන්න. සුභවාදී සිතුවිලි පමණක් ඔබේ දිවියට එක්කර ගන්න. ධනාත්මක හැකියාවන් ඔබේ දිවියට ආකර්ෂණය කර ගන්න. ඔබ මේ ගොඩනගන්නේ ඔබේ ආත්ම විශ්වාසයයි.

## ප්‍රතිඵලදායී දේ වෙත පමණක් යොමු වන්න....

සෑම විටම ප්‍රතිඵලදායී දේ වෙත පමණක් යොමු වන්න. ඔබ කරනා කාර්යන් හීදී යහපත් ප්‍රතිඵල නොනොලැබුණද ඒ තුළින්ද ජීවිතේ අලුත් දේ ගොඩනගා ගන්න උත්සුක වන්න. එවැනි අවස්ථාවන්හීදී සංසුන් වන්න. ඔබ විසින් උපයා ගන්නා සෑම සාර්ථක ප්‍රතිඵලයක් තුළින්ම ගොඩනැගෙන්නේ ඔබේ ආත්ම විශ්වාසයයි.

## ඉලක්ක පුංචි කොටස් වලට කඩා ගන්න.....

"උණු හින්දා බොන්නත් බෑ, කිරි හින්දා අහක දාන්නත් බෑ" වැනි කියමන් යටපත් කරගන්න. සියළු දේ එකවර ඉටුකර ගැනීමට නොපෙලඹෙන්න. ඔබට හැකිදේ වෙත යොමු වෙන්න. ඔබේ ඉලක්ක පුංචි කොටස් වලට කඩා ගන්න. ලොකු ලොකු දේ පසුවට කල් දාන්න. පියවරින් පියවර තබන්න. හැබෑ කර ගන්න පහසු පුංචි ඉලක්ක ගොඩනගා ගන්න. ඔබ ලබන පුංචි සතුට මගිනුත් ඔබේ ආත්ම විශ්වාසය ගොඩනැගෙනු නොඅනුමානයි.

## ඔබේ වීරයා ඔබම වන්න.....

ඔබේ හැකියා දක්ෂතා පිළිබඳ නිරන්තරයෙන් සතුටු වන්න. ඔබ ගැන ඔබ තුළම අභිමානයක් ඇති කරගන්න. නිහතමානී නිරහංකාර චරිතයක් ගොඩනගා ගන්න. ජීවිතය තුළ යම් යම් අසාර්ථක වීම් සිදුවුවත් ඒවායින් ඔබේ ජීවිතයට පාඩම් ඉගෙනගෙන නැවත එවැනි අතපසුවීම් සිදු නොවීමට වගබලා ගන්න.

## ඔබේ හිතවත්කම් තෝරා ගැනීමට ඔබ ඔබට සහය වන්න....

ඔබව අගය කරන පිරිසක්, ඔබව තේරුම් ගතහැකි පිරිසක් තුළ හිතවත්කම් සොයන්න. ඔබව විවේචනය කරන අය ඈත් කරන්න. ඔබ ආශ්‍රය කිරීමට තෝරා ගන්නා මිනිසුන් ගැන සැකිලිමත් වීමට පෙලඹෙන්න. සෑම විටම අයහපත තුළ ජීවිත සොයන්නවුන්ගෙන් ඈත් වන්න.

> උණු හින්දා බොන්නත් බෑ, කිරි හින්දා අහක දාන්නත් බෑ" වැනි කියමන් යටපත් කරගන්න. සියළු දේ එකවර ඉටුකර ගැනීමට නොපෙලඹෙන්න. ඔබට හැකිදේ වෙත යොමු වෙන්න. ඔබේ ඉලක්ක පුංචි කොටස් වලට කඩා ගන්න. ලොකු ලොකු දේ පසුවට කල් දාන්න. පියවරින් පියවර තබන්න. හැබෑ කර ගන්න පහසු පුංචි ඉලක්ක ගොඩනගා ගන්න. ඔබ ලබන පුංචි සතුට මගිනුත් ඔබේ ආත්ම විශ්වාසය ගොඩනැගෙනු නොඅනුමානයි.

## ඔබේ ජීවිතයේ ඇහුම්කන් දෙන්නා ඔබම වන්න....

ඔබ, ඔබේ ප්‍රශ්න තුළ ඔබ සමඟ නතර වන්න. ඔබේ ප්‍රශ්නයකට තවකෙකුගේ පිළිතුරක් නොගැලපිය හැකිය. එබැවින් නිරන්තරයෙන් ඔබ ඔබටම සාර්ථකව ඇහුම්කන් දී නිවැරදි තීරණ ලබාගන්න. ඔබේම ආත්ම විශ්වාසය තවත් ශක්තිමත් කර ගන්න.

## ඔබ තුළ අවබෝධාත්මක කළමනාකරණයක් නිර්මාණය කර ගන්න....

ඔබ කෙරෙහි අවබෝධයක් මනස තුළ සිතුවම් කරගන්න. සෑම කාර්යක් තුළම කළමනාකරණය මනාව පවත්වා ගැනීමට ඔබට සහය වන්න. ඔබ තුළ අවබෝධාත්මක කළමනාකරණයක් නිර්මාණය කර ගන්න.

ඉතින්, මෙම ලිපියේ ආරම්භයේ පටන් අවසානය තෙක් ඔබ රැගෙන ආ ඔබේ ආත්ම විශ්වාසය දිවියේ අවසානය තෙක්ම එලෙසම නොඅඩුව රැගෙන යන්න. ඔබේ ජීවිතයට වටිනාකමක් එකතු කර ගන්න. ජීවිතය සාර්ථකව ජය ගන්න. ඔබේ ආත්ම විශ්වාසය ගොඩනගා ගන්නට මා ගෙන ආ එකඳු වදනක් හෝ ඔබේ දිවියේ ආත්ම විශ්වාසයට රුකුලක් වේ යැයි සිතමි.

(තොරතුරු අන්තර්ජාලය තුළිනි)



සෙ/ සි03622
කාසෙ රෙජිනෝල්ඩ් එන්ජී
පර්යේෂණ සංකල්ප හා
මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලය



# ගජබා රජුගේ යුද කාර්යය

## මහා වංශයේ සඳහන් නොවන්නේ ඇයි?

වංකනාසිකතිස්ස රජුගෙන් පසු ඔහුගේ පුත් ගජබාහු රජු (ඇතෙකු මෙන් ශක්තිමත් බාහුවක් ඇති තැනැත්තා) (ක්‍රි.ව. 112-134) නීල මහා යෝධයා සමඟ කේරලයට ගොස් ලංකාවෙන් රැගෙන ගිය සිංහලයන් 12000 නිදහස් කරගෙන ඊට අමතරව නවත් සොලීන් 12,000 ක් මෙරටට රැගෙන ආ බව රාජාවලියේ සඳහන් වේ (රාජාවලිය, සුරවීර(සංස්.), පිටුව 58,59 පිටුව - 193,194) සොළී රජු විසින් කාවේරි නදියෙහි මහ වේල්ලක් බැඳවීම සඳහා සිහලුන් දොළොස් දාහක් අල්ලා ගෙන ගිය පුවත මහාවංශයේ සඳහන් නොවුනද පූජාවලියේ හා රාජාවලියේ සඳහන් වී තිබීම සැලකිය යුතු කරුණකි. එය ගජබා සටනෙහි සඳහන් වන්නේ මෙසේය.

වෙසෙස් එරජ ඉසුරෙන් සොම් පුල්ලා<br>
නිවෙස් සතුටු සිත කරමින් සියල්ලා<br>
සතොස් සොලි ගඟ මෙහෙකර ලොල්ලා<br>
දොළොස් දහස් සිර ගෙන ගිරය අල්ලා

*- (ද සිල්වා කේ එච්, සිංහල හටන් කවි, පිටුව 169)*

ගජබා රජු සොළී රටට ගොස් 24000 ක් ජනයා රැගෙන ආ ආකාරය පිළිබඳව 15 වෙනි ශත වර්ෂයේ රචනා කරන ලද පැරකුම්බා සිරිතෙහි මෙසේ දැක් වේ.

මෙකල රජකළ පවර ගජබා නිරිඳු මාවදු පුරෙන් සොළි රට<br>
එකල සැටවස් පුරාගෙන ගියෙ දොළොස් දහසක් දනන සිරකොට<br>
අසා රැහැණිව ගදාගෙන පසළොස් රියන්තුන් රියන් දිගවට<br>
මූදපීනා උරතලෙයි ගෑ සඳුන් නොමකා ගොසින් එනරට

පිවිස සොළිපුර එරජ ගෙට ගොස් සමඟ ඔහු සහසුනේ උන් සඳ<br>
මෙලෙස සිහළිඳු තනිව ආවේ කිමෙයි පුළුවුත් සෙමෙහි සොළි රද<br>
දෙළොස් දහසක් පෙරපනුවරින් දනන් ගෙන ආ නුඹගෙ පිය රද<br>
නොලස ගෙනයන ලෙසට ආමැයි කියත තෙපුලක් වෙමිනි වැඩි ඔද

නිරිඳ සීසී කියනු කිම බස් මෙසේ නොතකා අප සොළින් මැද<br>
තවද වැලිමැඩ තෙල්යපාදිය ගතැකිදෝ කවුරුන් විසින් තද<br>
එසඳ සොළියා බසට රැහැණිව ගද මිරිකා රුපැයි දියකඳ<br>
පැහැද දුනු නොව අඩු ගෙනාවේ සූවිසි දහසක් දනන් නොවරද

*- (පැරකුම්බා සිරිත, පද්‍ය 12-13-14 )*

වසභ රජුගේ පුත් වංකනාසික තිස්ස රජු දවස ඔහුගේ සොහොයුරන් දෙදෙනෙකු රුහුණු හා මායා යන ප්‍රදේශවල ස්වාධීන පාලනයක් ගෙන ගිය බවද එම කාලයේදී පාලනයේ බොහෝ දුර්වලතාවන් තිබූ බැව්ද වාර්ථා වේ. මේ රජුගේ රාජ්‍ය කාලය වසර 3 ක් පමණ වන අතර එහිදී දකුණු ඉන්දියාවෙන් මෙරට ආක්‍රමණය කොට සිංහලයින් දොලොස් දහසක් රැගෙන ගොස් ඇති බව සඳහන් වේ. වසභ රජ සමයේ (ක්‍රි.ව. 65-109) මෙරට පැවති දියුණු වාරි ඉංජිනේරු ශිල්පය පිළිබඳව විදේශ රටවල පවා ප්‍රචලිතව තිබූ අතර එම ශිල්පය දැන සිටි අය සොලී රජු විසින් අල්ලාගෙන ගොස් ඉන්දියාවේ කාවේරි නිම්නයේ වාරි කර්මාන්තයක් සඳහා යොදවන ලද බව විශ්වාස කෙරේ. මෙම පුවත ප්‍රථමයෙන්ම ඉතිහාසයේ වාර්තා වන්නේ පූජාවලියේය.

"ඔහු පින් වක්නැහැ නම් රජ තුන් අවුරුද්දක් රාජ්‍යය කළේය. ඔහු පුත් ගජබා නම් රජ තම පියා දවස ලක්දිවින් මිනිසුන් කාවේරියේ මෙහෙයවූ යෙති යනු අසා අමාත්‍යයන් ගෙන්වා විචාරා ....... (පූජාවලිය, 775 පිටුව)

සිංහල සිරකරුවන් වූ දොළොස් දහසක් හා ඒ හා සමාන සොලී ජනයා මෙරටට රැගෙන ඒම සඳහා ගජබාහු රජු නීල මහා යෝධයා සමග දකුණු ඉන්දියාවට ගිය බව මූලාශ්‍රවල සඳහන් වෙන අතර රජු මුහුදෙන් එතෙර වූ ආකාරයත් ඔහු එහිදී කළ වික්‍රමයන් පිළිබඳවත් අතිශයෝක්ති විස්තරද එම කථාන්තරවල ඇතුළත් වී ඇත්දැයි සිතෙයි. කෙසේ නමුදු ඒ සඳහා විශාල සේනාවක් එහි යන්නට ඇති බව උපකල්පනය කිරීමේ වරදක් නොමැත. එසේම ඔවුන් මෙහි රැගෙන ඒම සඳහා ප්‍රබල නාවුක ක්‍රමවේදයක් තිබෙන්නට ඇති බවද විශේෂයෙන් අවධානයට යොමු විය යුතු කරුණකි.

සිංහලයින් හා ද්‍රවිඩයින් 24,000 මෙරටට රැගෙන ආවේ කෙසේ දැයි වැඩි විස්තර ඓතිහාසික මූලාශ්‍රවල වාර්තා නොවුනද ගජබා රජු විසින් රැගෙන ආ සොලී ජනයා උඩුනුවර, යටිනුවර, දුම්බර, තුම්පනේ හා හාරිස්පත්තුව යනාදී ප්‍රදේශයන්හි පදිංචි කර වූ බැව් රාජාවලියේ සඳහන් වේ. තවද ඔවුන් ලංකාවේ ඒ ඒ පළාත්වල පදිංචි කරවන ලද බව මාතලේ කඩයිම් පොතේ අතුරු පුවතක් හැටියට දක්වා තිබේ. ඒ අනුව සොලී රටින් ගෙනා පිරිසෙන් මාතලේ තුන් කෝරළයේ පදිංචි කරවන ලද සංඛ්‍යාව මුදලිවරු තුන් දෙනෙක් සහ සෙසු පිරිස 300 ක් බව විශ්වාස කරන අතර මහා බල සෙනගක් යැවූ බව මාතලේ කඩයිම් පොතේ සඳහන් වේ. තවද මහ සෙනගක් හෙවත් මහා තලයක් පැමිණි නිසා මහතලාව ලෙස පට බැඳී එය පසුකාලීනව මාතලේ ලෙස ව්‍යවහාර වූ බව ජනප්‍රවාදයයි.

වංකනාසිකතිස්ස රජුගේ සමයේ සිදුවූයේ ආක්‍රමණයක් නොව දෙරට අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික කටයුත්තක් බව ඇතැම් ඉතිහාසඥයින්ගේ අදහසයි. ක්‍රි.ව. 2 වන ශත වර්ෂයෙහි කේරළයෙහි අධිරාජයා වූ චෙරන් සෙන්ගුට්ටුවාන් රජු විසින් පත්තිනි දේවාලයක් කරවා එය විවෘත කිරීමේ උත්සවයට ලක්දිව ගජබා රජුට ආරාධනා කළ බවත් එයට සහභාගී වූ ගජබා රජ පෙරළා ලක්දිවට පැමිණීමේදී පත්තිනි දෙවියන්ගෙන් වර ලබා ඇයගේ සළඹද ගෙනා බවත් ඉන්පසු ලක්දිව පත්තිනි දේවාල කරවා උත්සව පැවැත් වූ බවත් සීලබ්දිකාරම් නම් ද්‍රවිඩ මහා කාව්‍යයෙහි සඳහන් වේ. ගජබා රජු ආපසු පැමිණෙන ගමනේදී නාවගමුව අසල තාවකාලිකව නවාතැන් ගත් බවද එබැවින් එම ස්ථානයේ පත්තිනි දේවාලයක් කරවූ බවද ජනප්‍රවාදයේ එයි.

ගජබා රජුගේ කේරල ආක්‍රමණය පිළිබඳ ප්‍රවෘත්තිය පූජාවලිය, රාජාවලිය, ගජබා හටන හා පත්තිනි හෑල්ල ආදී මූලාශ්‍රයන්හි විස්තර වුවත් මහාවංශ කතුවරයා මෙම පුවත බැහැර කර ඇත්තේ කුමන කාරණාවක් නිසාදැයි තේරුම්ගත නොහැක. එහෙත් ගජබා රජු අභයගිරි වාසී භික්ෂූන්ට විශේෂ අනුග්‍රහ දැක්වූ තැනැත්තෙකු බැවින් මහා විහාර පාක්ෂික මහාවංශ ලේඛක මහානාම හිමි විසින් මෙම සිද්ධිය මහාවංශයට ඇතුලත් නොකරන්නට ඇති බව අනුමාන කිරීම තර්කානුගෝචරය. තවද ථේරවාද බුද්ධාගමට පටහැණි වූ පත්තිනි ඇදහිල්ල එම රජුගේ කාලයේ ලංකාවේ ඇරඹුණු නිසාවෙන් වංශ කතාවට ඔහු පිළිබඳව විස්තර ඇතුළත් නොකරන්නට ඇති බව ද සලකනු ලැබේ.

ඉහත කරුණු නිසා මෙය සත්‍ය සිදුවීමක්ද යන්න ඇතැමුන්ගේ සැකයට බඳුන් වී තිබේ. මහාවංශයේ සඳහන් නොවන නමුත් අනෙකුත් වාර්තාවන් නිසා ආරක්ෂා වී ඇති ගජබා මෙහෙයුමට සත්‍ය ප්‍රවෘත්තියක්ම පදනම් වී ඇති බව නිශ්චය කිරීමට ඉහත සඳහන් කළ අනෙකුත් මූලාශ්‍ර ප්‍රමාණවත් සාක්ෂි නොවන්නේද යන්න ගැටළුවකි.

ගජබාහු රජු විසින් සිංහලයින් 12,000 ක් සහ චෝලයින් 12,000ක් මෙරටට ගෙන එද්දී පත්තිනි දෙවියගේ රුවන් සළඹත්, වළගම්බා රජ සමයේ ගෙන යනු ලැබූ බුදුන් වහන්සේගේ පාත්‍ර ධාතුවක් ආපසු මෙරටට ගෙන එන ලද බවට එම පුවත විකාශනය වී ඇත. වළගම්බා රජු දවස පාත්‍රා ධාතුව රැගෙන ගියේ පාණ්ඩ්‍ය දේශයට වුවත් මේ වනවිට එය චෝලයින් අතට පත්වී තිබුණි. අනෙක් අතට පාන්ඩ්‍යයින් සහ චෝලයින් යන දෙපක්ෂයම හින්දු භක්තිකයින් වූ නිසා බුදුන් වහන්සේගේ පාත්‍රා ධාතුව ඔවුනට වැදගත් වූයේ කිනම් කටයුත්තක් නිසා ද යන්නත් ගැටළුවකි. රාජ්‍යයේ හිමිකම පෙන්වන සංකේතය වශයෙන් එවකට සලකන ලද්දේ බුදුන් වහන්සේගේ පාත්‍ර ධාතුව වීම ඊට හේතුවයි. කෙසේ නමුදු වංකනාසිකතිස්ස රජු දවස සිදුවූ ආක්‍රමණය හා ගජබාහු රජු සොළී රටට ගොස් තම රට වැසියන් නිදහස් කරගෙන ආපසු රැගෙන ඒම ඉතිහාසයේ සුවිශේෂී සංග්‍රාමයක් ලෙස පිළිගැනීමට බාධාවක් නොමැත.

ඉහත සඳහන් ප්‍රවෘත්තිය අනුව ශ්‍රී ලාංකික පාලකයකු විදේශ ආක්‍රමණයක් සිදු කළ බව ප්‍රථම වරට සඳහන් වන්නේ ගජබා රජුගේ කාලයේ දී බවට විවාදයක් නොමැත. එහෙත් විදේශ රටවලට පවා ගොස් යුද්ධවලදී වීර ක්‍රියා කළ ගජබා රජුගේ රණ ශූරත්වය වංශ කතාකරුවන් විස්තර කර ඇත්තේ වැඩි උනන්දුවකින් නොවන බව කිව යුතුය. ගජබාහු රජුගේ දස්කම් නිසා ජාතියට යම් ගෞරවයක් ලැබෙන්නට ඇතත් ඒවා නොමසුරු ලෙස වර්ණනා කිරීමට ඒ වංශකතා ලේඛකයින් රුචියක් දක්වා ඇති බවක් හඳුනාගත නොහැක.

**ඉහත සඳහන් ප්‍රවෘත්තිය අනුව ශ්‍රී ලාංකික පාලකයකු විදේශ ආක්‍රමණයක් සිදු කළ බව ප්‍රථම වරට සඳහන් වන්නේ ගජබා රජ්ජුගේ කාලයේ දී බවට විවාදයක් නොමැත. එහෙත් විදේශ රටවලට පවා ගොස් යුද්ධවලදී වීර ක්‍රියා කළ ගජබාහු රජ්ජුගේ රණ ශූරත්වය වංශ කතාකරුවන් විස්තර කර ඇත්තේ වැඩි උනන්දුවකින් නොවන බව කිව යුතුය. ගජබා රජ්ජුගේ දස්කම් නිසා ජාතියට යම් ගෞරවයක් ලැබෙන්නට ඇතත් ඒවා නොමසුරු ලෙස වර්ණනා කිරීමට ඒ වංශකතා ලේඛකයින් රුචියක් දක්වා ඇති බවක් හඳුනාගත නොහැක.**

*මේජර් සරත් ජයවර්ධන විසින් රචිත "ලක්දිව සංග්‍රාම ඉතිහාසය" ග්‍රන්ථයෙනි.*




## නිහඬ ප්‍රේමය ...

ජීවිතය පුදසුනකි විටෙක මල් හිනැහෙන
පින් සුවඳ හෙමි හෙමින් හදවතෙහි පැතිරෙනා
බොහෝ විට මා නොලද සතුට හද බැමි කඩා
ඇතුල්වය හදවතට නුඹෙ දෙනෙත් දුටු නිසා
හැඟුම්බර තනි හිතක හද ගැස්ම ඇහෙනවා
තවත් සුන්දර හෙටක් ආදරෙන් පතනවා
නිල්පාට හීනයක නෙත දෑස් ගිලෙන විට
දුක සතුට අතරමැද යනෙන මං හොයනවා
කඳුලකින් පිරුණු මගෙ නෙත් ඉවුර බිඳී ගොස්
කොපුල් උණුසුම් කරයි සිතම දැවෙනවා

සෙ/2099393
ආසෙ ජයසිංහ බීච්චන්ඩී - 1 ශ්‍රීලපාහ

## දිනුම සහ පැරදුම...

දිනක් සාර්ථක වූ විට කල්පයක්
ආඩම්බර නොවන්න...
දිනක් අසාර්ථක වූ විට කල්පයක්
කණගාටු නොවන්න...
සැමදා දිනුම්ද, සැමදා පැරදුම්ද නැත

සෙ/17කිච01931
කෝප්‍රල් ඒකනායක ඒචම් - 17 ශ්‍රීලංපාආබමු

## රණවිරුවා...

සුදු අරලිය මල් සුවඳට පිපිලා
අයියන්ඩියෙ නුඹෙ සොහොන් බිමේ...
ඒ මල් පරව් කඩා හැලෙන මුත්
කවුරුත් නෑ ඒ බව දුටුවේ...

රට දැය වෙනුවෙන් සිංහ පුතකු ලෙස
දිවි පිදුවා ඔබ යුද පිටියේ...
නුඹ ගැන සිහිවෙන හැම වාරෙක
කඳුළු නැගෙයි දෙනෙතට හැමවෙලේ...

සෙ/534733
පාසෙ එදිරිසිංහ ඊචම්සින් - 24 විපාරෙ

## සෙබළ තනිකම...

මෙලොව උපත ලද
සැම අයකු හට
උරුම නියතය අනියත වුවත්
එහෙත් අප සැම
දුවන්නේ අනියත නියත යැයි සිතසිතා
නොදකින අනාගතයක් වෙත
පොඩි බැඳන් හදවත පුරා
අද දවස ඇයි විඳින්නේ දුක්
හෙට දවස ගැන සිතසිතා
දිනක අප මියැදෙනු ඇත
සියලු දේ හැරදමා
එතෙක් එක්ව සිටිමු අපි
සතුට පොඩි බැඳන් හදවත පුරා

සෙ/776563
මා/සැරයන් බංඩාර
ඩබ්ලිවපීචම්වන්කේඑස් - 2 සබුබ

## අප විරුවාණෝ...

ලක් දෙරණ සුරකිමින්
ජීවිතය උකසට තබමින්
මිහිතලය රැක ගනිමින්
සේවය කළ අප විරුවාණෝ

වැඳුණු සැර උණ්ඩයෙන්
දෑස් අත්පා අහිමි කරමින්
ජාතියම හඬවමින්
සේවය කළ අප විරුවාණෝ

සිහිය විකලින් ඇවිදිමින්
අත්වාරුවක ආධාරයෙන්
පාදයක වාරුවෙන්
පියනගන විරුවාණෝ

පැළඳ සහය පාදයෙන්
දිරිදිව පෙවෙත රැකෙමින්
ඔබට උත්තමාචාරය
පුදකරමි විරුවාණෝ...

සෙ/652661
කෝප්‍රල් ආරියරත්න ජේඩීජේ
1 ශ්‍රීලයුවෙබ

## හීනය...

තාත්තාගේ ඩා දියෙන්
අම්මාගේ සෙනෙහසින්
තැනුණු දිවි බිත්තියෙන්
පාට යන්නට නොදී
හෙට දිනේ නැකතකට
ජීවිතේ වහලේ මං
ගහනවා ඔව් තදින්
තාත්තාගේ හීනේ මං රකිනවා...

සෙ/420280
කෝප්‍රල් නිරංජන ආඩීසී ආර්ඩබ්ලිවපී
ආර්එස්පී - 11 ගැහේබ

## දරාගැනීම...

නිවාඩු නෑ නේද අයියාට
යාළුවෝ කතාකරා නේද යන්න ඇවිදින්න
ඒත් ඉතින් හැමෝම එක්කම එද්දි බෝයි ෆ්‍රෙන්ඩ්
කොහොම යන්නද ඇවිදින්න උඹ තනියෙන්...

ඔෆිස් එකේ හැමෝම සඳුදාට කියනව නේද
ගියපු ගමන් සති අන්තෙට
තිබුණත් වෙලාව ඕනවාටත් වැඩියට
තනියම ගිහින් කොහොමද ගමන් මං තනියම...

වෙසක් එකට වෙසක් බලන්න
කතා කරා යාළුවෝ යං හවසට කොළඹට
උඹත් හා කිව්වා තියෙන ආසාවට
ඒත් ඉතින් පස්සෙයි තේරුණේ
යන්න වෙන්නෙ තනියෙන්...

කොහොම හරි දාලා මායං ඔයාගේ
ගත්තා අවසරය බලන්න යන්න වෙසක්
නංගිත් එක්ක ගියත් බලන්න වෙසක්
හැමතැනම අතින් අල්ලන් යනවනෙ
හරි ආදරෙන් කපල්...

ඒ පුංචි වේදනාවත් දරන්
ඔයත් ඉන්නේ මහා කැපකිරීම් ගොඩක් කරන්
දරාගන්න පුරුදු වෙන්න අපි ආමි කෝස් කළත්
මට දැණුනේ නුඹත් ෆෝසස්... කෝස් නැතිව
මේ හැමදේම දරන් ඉන්න හැටි බලන්...

ලූතිනන් නිපුණු පීරිස් - 3(සෙව) ගැහේබ

## අම්මා...

මිහිමඬලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා
අහස් තලෙන් මරු කතරට වහින වැස්ස අම්මා
පන්සලක් තරම් හිත නිවන තැනක් බුදුරුව වගේ
හිතට දැනුණු රුවක් තිබුණානම් තවත්
ඒ අම්මාම විතරමයි...

සෙ/163916
ලා/බෝ කුමාර ඊකේපීසීඩී

## කියනවද ආදරෙයි මට...

හිතුවෙ නෑ මුණගැහෙයි කියලා කවදාවත්ම
කෙස් ගහක් දෙකක් පැහුනට
පරණ පෙම් පාටමයි ඇස්වල
උඩු රැවුලත් වවල ඇත්තටම...

මතකයි ඉස්කෝලෙ කාලේ
තිබ්බ ආසාව ඕකට
කියන්නකො ඉතින් කොහොමද
නෝනට එහෙම...

ඇයි ඉතින් කඳුළු ඇස්වල
ඔයා රට යනකොට
බඩට මාස දෙකයි යන්තමට
අම්මට අහුවුණා කනකොට
අන්නාසි ගැට...

ඊට පස්සේ මම හිටියේ
ලොකු අම්මලාගේ ගෙදර
හම්බවෙනකොටම නැති උනා
ඔයාගෙ ලේ උරුමෙ මට...

සමාව දෙන්න රත්තරං
මොනව කරන්නද මම
ඊට පස්සෙ
කාලයක් උන්නේ අංගොඩ...

අම්මවත් ආවේ නෑ බලන්න එහෙම
එහෙන් පැනල යනකොටයි
හම්බඋණේ "මැඩම්ව" මට
සලකපු විදියට හිතුවෙ නෑ
නපුරක් කරයි කියල මට...

නාඳුනන මිනිහෙක් අතින්
දෙවනි පාරටත් ගෑණියෙක් වෙනකොට
යන්තම් අවුරුදු විසිදෙකයි මට
නාඩා ඉන්න ඔයා මොනව කරන්නද
මගේ කරුමෙට...

ගෙදර ගියේ නෑ ඉතින් ආයෙත් මම
අම්මෝ අවුරුදු විස්සකට කිට්ටුයි
මේ වෙනකොට...

බිස්නසුත් නෑ දැන්නම් මට
ඉඳල හිටලා එන කස්ටමර් කෙනෙක් ඇරුනම
වෙන වෙන බිස්නස් තමයි වැඩිපුර
ඒවත් අඩුවෙලා දැන් හොඳටම...

ඒත්, හීනෙකින්වත් හිතුවෙ නෑ
ජීවිතේ හම්බවෙයි කියලා
හොටෙල් කාමරයක් ඇතුළෙ ආයෙමත් මට...

හැරිල බලනකොට අයෙත් ආපස්සට
අම්මෝ අවුරුදු විස්සකට කිට්ටුයි මේ වෙනකොට
අනේ රත්තරං ඔළුව උස්සල බලනවද
ඉස්සර වගේ ලස්සන නැද්ද මම
එකම එක පාරක් ආයෙමත් කියනවද
ආදරෙයි කියල මට
සල්ලිනම් ඔයාගෙන් සතපහක් එපා මට...

සෙ/21ඕ00470
කෝප්‍රල් පතිරණ පීඑන්ජී - 17 (සෙව) ශ්‍රීලපාහ

## 22 විපාරෙ...

විපාරෙ විපාරෙ 22 විපාරෙ
වල් වල් මාවල්ආරුව අතරෙ
දිලෙමින් හොඳ නම සැමදෙන අතරෙ
එඩිතර විනයක් රැකදෙයි නිතරෙ

අණදෙමින් අඩුවක් නැත සැමතැන
උපදෙස් ඉහළයි CO අණදෙන
නිලධාරී සහ සෙසුනිල පාලන කරමින
22 ඉහළට ගෙනයයි සැමදින

මහජන විශ්වාසය දිනු කල්හිම
සැමතැන හමුදාවටමයි පැසසුම
දෙන්නෙම් ආරක්‍ෂාවක් නිතරම
සෙබළුනි අප හැමගේ එම වගකීම

විනයට මුල්තැන පුහුණුව කඳිමයි
පුහුණුව මුල්තැන යුද්දෙට කඳිමයි
යුද්දෙට මුල්තැන විරුවා කඳිමයි
විජයබාහු විරුවන් යුද්දෙට කඳිමයි

සෙ/515830
බනි 11 විජේනායක එම්ජීඑන්
ආර්ඩබ්ලිව්පි ආර්එස්පී - 22 විපාරෙ

## කවියෙකුගේ පෙම්වතියට...

කුණාටුව එනු දැනත්,
වැස්සටම කවි ලියවෙමි..
හිමාවක සලකුණක්,
ගිම්හානය තුල නොවුණි..

පැලැස්තර ගලවමින්,
තුවාලය දෙස බලමි..
සුව නොවන ලෙස,
යළි යලිත් පතුරු ලමි..

අළුත් පව අමුණමින්,
කවියකට මුලපුරමි..
ලියූ හැම පේලියෙම,
රුහිරු පැල්ලම් තිබුණි..

පිස්සු බව පවසමින්,
දින පොත් පිටු පෙරලා බලමි..
මම හොඳින් යැයි පවසමින්,
අවපසට දුක කියමි..

අත නොහැර හුස්ම දෙන,
නුඹයි මගේ සඳ කුමරි..
ප්‍රේමයේ අන්ධකාරයෙන්,
මා මුදවාගනු මැනවි....!

ලුතිතන් අශේන් කුලසිරි
16 ගරෙ

## නොයන් හැරදා කුමරියේ...

මහ සුළඟට නොනිවෙන සේ
එළිය දෙන්න පහනක් වී
දිවි ඇතිතුරු මේ හදවතේ
දෙන්න සතුට නිති රන්දා
ඔබේ ආදර වදන්වලින්
මේ හදවත පුරවනු මැන
ආදර රැගුමන් රගමින්
සතුට දෙන්න මගේ නෙත්හට
මගේ ලොවින් පලා නොයන්
සිතුම් පැතුම් ඉටුවෙන තුරු
එළිය දෙන්න මගේ දිවියට
බැබලෙන්නට පහන් තරුව සේ...

සෙ/සී100887
කෝප්‍රල් රාජකරුණා ආර්ඒඑම්ටී
2(සෙව) ශ්‍රීලංසංබ

## සෙබළු තනිකම...

වසන්තයේ මල් පිපිලා
ඒ මල්වල සුවඳින් මුළු පළාතම
සුවඳවත් වෙලා...
මල් මාවතේ මල් කුමර කුමරියන්
එහාට මෙහාට ඇවිදිනවා
ලස්සන ලතාවට...
මොනරතම් ලස්සනද
ඒත් මං සතරවට තල් කොටවලින්
වටකරන ලද බංකරයකට වෙලා
කල්පනා ලොවක තනිවෙලා
මාත් ආසයි ඒ වගේ
ලස්සන ලතාවට ඇවිදින්න
ඒත් කෝ මට පෙම්වතියක්
මා පෙම්වතිය අත රැඳි ගිනිඅවියක්

සෙ/164365
ලා/බෝ විජේසිංහ ජේපී - 10 ශ්‍රීලකාහ

## ඉපදුණු තනිවුණු මතකය...

තනිවුන මලකි මා මේ යුද පිටිය මැද
වෙඩි උණ්ඩයකට බිය නැත එකම මල
සෙබළා නමුදු යුද පිටියක එකම මල
යුද ගිනිදැල් ආවත් පර නොවනු මල
රට වෙනුවෙන් තම දිවියම කැපකරන මල
සෙබළා නමුදු මරු කතරකි
තනිවුණු සොඳුරු මල
සිහිකෙරුමට පිපුණා
රතු පැහැ පොපි මල

සෙ/165741
තුසෙ බංඩාර එම්පීයූසී
10 ශ්‍රීලකාහ

# කෙළිබිම

## යුද පිටියෙන් ක්‍රීඩා පිටියට



# ජාත්‍යන්තර ජයග්‍රහණ

## 36 වන ලෝක ශූරතා සේපක්ටැක්රෝ තරගාවලිය - 2023



36 වන ලෝක ශූරතා සේපක්ටැක්රෝ තරගාවලිය ඉකුත් ජූලි මස තායිලන්තයේදී පැවැත්විණ. මෙම තරගාවලියට ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේපක්ටැක්රෝ සංචිතය නියෝජනය කරමින් සහභාගි වූ සෙ/2ආර්03169 සැරයන් නදීෂා හර්ෂණී කේ, සෙ/2ආර්101727 කෝප්‍රල් බණ්ඩාර එච්ආර්කේයූ, සෙ/ආර්101733 ලා/කෝ ගමපතිරණ එස් සහ සෙ/101855 කාසෙ ජයම්පති ඩබ්ලිව්ඩීඑස් එහිදී සුවිශේෂී දක්ෂතා දැක්වීමට සමත්වූහ. යුද්ධ හමුදා සේපක්ටැක්රෝ සංචිතය යුද්ධ හමුදා පාපන්දු කමිටුවේ සභාපති මෙන්ම පිරිස් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේර්ල කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී යටතේ පවත්වාගෙන යනු ලබයි.

# ජාතික ජයග්‍රහණ



## 47 වන ජාතික ක්‍රීඩා උළෙලේ කායවර්ධන තරගාවලිය



ක්‍රීඩා හා යොවන කටයුතු අමාත්‍යාංශය වෙතින් සංවිධානය කළ 47 වන ජාතික ක්‍රීඩා උළෙලේ කායවර්ධන ඉසව්ව, දිවයිනේ විවිධ පළාත් නියෝජනය කරමින් කණ්ඩායම් 09කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් ඉකුත් අගෝස්තු 05 වන දින ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් (*Duncan White*) ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙම තරගාවලියේදී, යුද්ධ හමුදා කායවර්ධන ක්‍රීඩකයෝ රන් පදක්කම් 02 ක් සහ ලෝකඩ පදක්කම් 02 ක් දිනා ගැනීමට සමත්වූහ. එහිදී, යුද්ධ හමුදා පොදුසේවා බලකායේ ලාන්ස් කෝප්‍රල් මැගිනආරච්චි ජීකේ දක්ෂතම කායවර්ධන ශූරයාට හිමි කුසලානය දිනාගත්තේය. මෙම තරගාවලිය සඳහා යුද්ධ හමුදා ක්‍රීඩකයින් 07 දෙනකු සහභාගී වූහ.

## ජාතික හෑන්ඩ්බෝල් ශූරතාවය - 2023





ශ්‍රී ලංකා ජාතික හෑන්ඩ්බෝල් ශූරතාවලිය - 2023, පුත්තලම මහජන ක්‍රීඩාංගණයේදී පසුගිය අගෝස්තු මස 11 දින සිට 14 දින දක්වා පැවති අතර, එහිදී ශ්‍රී ලංකා නාවික හමුදා කණ්ඩායම පරදවා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම විසින් එහි පිරිමි අංශයේ ශූරතාව හිමිකර ගන්නා ලදී. දිප ව්‍යාප්තව කාණ්ඩ හතරක් යටතේ හෑන්ඩ්බෝල් පිරිමි කණ්ඩායම් 21 ක් මෙම තරගාවලිය සඳහා තරග කළහ. එහිදී, අවසන් තරගයේදී යුද්ධ හමුදා හෑන්ඩ්බෝල් කණ්ඩායම ලකුණු 36 - 31 ක් ලෙස ශ්‍රී ලංකා නාවික හමුදා හෑන්ඩ්බෝල් කණ්ඩායම පරදවා ශූරතාවය දිනාගැනීමට සමත් විය. තරගාවලියේදී යුද්ධ හමුදා හෑන්ඩ්බෝල් කාන්තා කණ්ඩායම පරදවා ගුවන් හමුදා හෑන්ඩ්බෝල් කාන්තා කණ්ඩායම ලකුණු 21 -25 ක් ලෙස ලබා ගනිමින් කාන්තා අංශයේ ශූරතාවය හිමිකර ගත්හ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ කෝප්‍රල් විමලරත්න ඩීජීආර්, ශ්‍රී ලංකා පාබල හමුදාවේ ලාන්ස් කෝප්‍රල් කරුණාරත්න ආර්ඩීඒආර් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ පත්මකුමාර කේඩී යන ක්‍රීඩකයෝ තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා, අවසන් තරගයේ දක්ෂතම ගෝල රකින්නා සහ දක්ෂතම ක්‍රීඩකයා ලෙස කුසලාන හිමිකර ගත්හ.

# අන්තර් රෙජිමේන්තු ජයග්‍රහණ

## යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරගාවලිය





යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරගාවලිය ඉකුත් අගෝස්තු 09 වන දින මත්තේගොඩ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා ස්කොෂ් පිටියේදී පැවැත්විණි. එහිදී, දින දහයක් පුරා රෙජිමේන්තු 13 ක් නියෝජනය කරමින් තරග ඉසව් 11 ක් යටතේ ක්‍රීඩකයෝ තරගවැදුණහ. අවසන් මහා තරගයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්කොෂ් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී සහභාගී විය. එහිදී, තියුණු තරගයකින් අනතුරුව තරගාවලියේ පිරිමි විවෘත කණ්ඩායම් ශූරතාවය ගජබා රෙජිමේන්තුව දිනාගත් අතර අනුශූරතාවය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා ක්‍රීඩකයෝ හිමිකරගත්හ. එහි තෙවන ස්ථානය හිමිවූයේ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායටය.

# අන්තර් ඒකක ජයග්‍රහණ

## අන්තර් ඒකක පිහිනුම් ශූරතාවලිය - 2023





ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා "අන්තර් ඒකක පිහිනුම් ශූරතාවලිය -2023" අවසන් මහා තරග සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය පසුගිය අගෝස්තු මස 18 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපද පිහිනුම් සංකීර්ණයේදී පැවැත්විණි. විවෘත කාණ්ඩ යටතේ පැවති මෙම පිහිනුම් තරගාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ ඒකක හතක්, විශේෂ විමර්ශන ඒකකය සහ යුද්ධ හමුදා පොලිස් සේවා බලකා පුහුණු පාසල නියෝජනය කරමින් නවක සෙබළු ඇතුළු එම බලකායේ පිහිනුම් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 75 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූහ. එහිදී, පිහිනුම් ශූරතාවලියේ පිරිමි අංශයේ ශූරතාවය 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා කණ්ඩායමත්, අනුශූරතාවය 2 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා කණ්ඩායමත් හිමිකර ගනු ලැබූහ. එහිදී, පිරිමි අංශයේ දක්ෂතම පිහිනුම් ක්‍රීඩකයා ලෙස 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායෙහි සාමාන්‍ය සෙබළ තෙන්නකෝන් ටීඑම්එස්ඩී සම්මාන ලැබීය. එහි කාන්තා ශූරතාව ගිරිතලේ, යුද්ධ හමුදා පොලිස් සේවා බලකා පුහුණු පාසලේ ක්‍රීඩිකාවෝ දිනාගත් අතර, තරගාවලියේ දක්ෂතම පිහිනුම් ක්‍රීඩිකාව ලෙස 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායෙහි ලාන්ස් කෝප්‍රල් බණ්ඩාර ඩබ්ලිව්එම්කේඩී සම්මාන හිමිකර ගත්තාය.

# "අයන් රයිඩර්ස්" (Iron Riders) පාපැදි තරඟාවලියේදී යුද්ධ හමුදාවට ජයග්‍රහණ රැසක්





දිවුලපිටිය, මරදගහමුල "අයන් රයිඩර්ස්" (Iron Riders) ක්‍රීඩා සමාජය වෙතින් සංවිධානය කරනු ලැබූ පාපැදි තරඟාවලියේ පිරිමි කාණ්ඩයේ 03, 04, 05, 06, 15 සහ 17 යන ස්ථාන ජයග්‍රහණය කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පාපැදි තරඟකරුවෝ සමත්වූහ. එහිදී, යුද්ධ හමුදා පාපැදි ක්‍රීඩිකාවෝ කාන්තා තරගයේ 08 සහ 10 වන ස්ථාන හිමිකරගැනීමට සමත්වූහ.

ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය සහ ගම්පහ දිස්ත්‍රික් පාපැදි සංගමය එක්ව සංවිධානය කළ මෙම තරඟාවලිය අගෝස්තු මස 20 වන දින දිවුලපිටිය නගර මධ්‍යයෙන් ආරම්භ කරනු ලැබීය. යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා පාපැදි සංගමයේ සභාපති මේජර් ජෙනරාල් ජේඒආර්එස්කේ ජයසේකර යූඑස්පී පීඑස්සී විසින් යුද්ධ හමුදා රෙජිමේන්තු නියෝජනය කරනු ලබන පාපැදි ධාවකයින්ට මෙම තරඟාවලිය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබාදී තිබිණ. මෙම පාපැදි තරඟාවලිය සඳහා යුද්ධ හමුදා කණ්ඩායම් සමගින් නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලිසිය, වරාය අධිකාරිය සහ දෙහිවල ගල්කිස්ස මහනගර සභාව නියෝජනය කරමින් 100 දෙනකුට අධික තරඟකරුවෝ පිරිසක් එක්වූහ.


# ආරක්ෂක සේවා පැසිපන්දු තරඟාවලිය - 2023 හි ශූරතාවය යුද්ධ හමුදාවට







"ආරක්ෂක සේවා පැසිපන්දු තරඟාවලිය - 2023" හි අවසන් අදියරේ තරඟ අගෝස්තු මස 25 දින පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැසිපන්දු කමිටුව විසින් සංවිධානය කරනු ලැබූ මෙම තරඟාවලියේදී ඒ ඒ කණ්ඩායම් අතර පැවතියේ තියුණු තරඟයකි. එහිදී, පිරිමි ඛාණ්ඩයේ ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැසිපන්දු කණ්ඩායම දිනාගත් අතර අනුශූරතාවය ශ්‍රී ලංකා නාවික හමුදා කණ්ඩායමට හිමිවිය. තරඟාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා පැසිපන්දු කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ආර්ඩබ්ලිව්ඩබ්ලිව්එච්ජේබී වනිගසේකර ඩබ්ලිව්එස්වී යූඑස්පී සහභාගී විය.






# 'American's Inspiring Urologist of the Year'

# සම්මානයෙන් පිදුම් ලැබූ

## කොළඹ යුද්ධ හමුදා රෝහලේ මෛත්‍ර රෝග විශේෂඥ වෛද්‍යවරයා

වකුගඩු ආශ්‍රිත හටගත් ලොව විශාලතම සහ දිගම ගල (*Calculus*) ඉවත් ඉවත් කරමින් ගිනස් වාර්තා පොතට ඇතුළත් වූ කොළඹ යුද්ධ හමුදා රෝහලේ මෞත්‍ර රෝග විශේෂඥ වෛද්‍ය ලුතිනන් කර්නල් කුගදාස් සුතාර්ෂන් *'American's Inspiring Urologist of the Year'* සම්මානය සඳහා නිර්දේශ කර ඇති බව ඇමරිකා එක්සත් ජනපදයේ එක්සත් පර්යේෂණ කවුන්සිලය විසින් ඉකුත් අගෝස්තු 23 වන දින නිවේදනය කරන ලදී. සුවිශේෂී කුසලතා, විශිෂ්ටත්වය, පලපුරුද්ද සහ නිර්මාණශීලීත්වය අදාළ ක්ෂේත්‍රවල ප්‍රගමණයට යොදාගනිමින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන විශිෂ්ටයින් වෙනුවෙන් ගෞරවයක් එක්කිරීම සඳහා මෙම සම්මානය ලබාදෙයි.

වසරේ විශිෂ්ටතම මෞත්‍ර ආශ්‍රිත වෛද්‍යවරයාට හිමි සම්මානය ප්‍රදානය කරනු ලබන *'The American Awards'* සඳහන් කර සිටියේ එවන් විශිෂ්ට පුද්ගලයන්ට ජාත්‍යන්තර මට්ටමේ ගෞරවයක් ලබාදීමත් ඔවුන්ගේ සාර්ථකත්වය පිළිබඳව ලෝකවාසීන් දැනුම්වත් කිරීමත් ඔවුන්ගේ ප්‍රයත්නය බවයි.


# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
කේඩබ්ලිව්එස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී




**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආර්එම්එච්පීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්එල්යූ ලක්ෂිකා

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණි ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිගුව**

51445/51446

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

# යුද්ධ හමුදා නිවේදක ශිල්පීන් සඳහා වැඩමුළුවක්

යුද්ධ හමුදාවේ අංශ, ආයතන තුළ සංවිධානය කරනු ලබන යුද්ධ හමුදා උත්සව අවස්ථාවන් සඳහා යොදවා ගැනීමට හැකිවන පරිදි නිවේදක ශිල්පීන් පුහුණු කිරීමේ වැඩමුළුවක් ඉකුත් අගෝස්තු 07 වන දින සිට 23 වන දින දක්වා යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. යුද්ධ හමුදාධිපතිගේ අනුමැතිය මත පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයවීමෙන් පැවති මෙම වැඩමුළුව මගින් යුද්ධ හමුදාව තුළ පවත්වන උත්සව අවස්ථාවන්හි විවිධත්වය හඳුනාගෙන එම වැඩසටහන්වලට ගැළපෙන ආකාරයට නිවේදන පිටපත සකස් කිරීම, එම පිටපත සාර්ථකව ඉදිරිපත් කිරීමට අවශ්‍ය දැනුම, අවබෝධය, න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ලබාදීමද කටහඬ අභ්‍යාසද සිදුකරන ලදී.






තෝරාගත් සෙබළ සෙබළියන් 30 දෙනකු වෙනුවෙන් දින 10 ක් පුරා පැවති මෙම වැඩමුළුවේදී ශ්‍රී ලංකා ගුවන් විදුලි පුහුණු අභ්‍යාස ආයතනයේ පුහුණු උපදේශිකා ප්‍රියංකා තුෂාරි වෙලගෙදර මහත්මිය, සිරස රූපවාහිනිය හා ආරක්ෂක අමාත්‍යාංශයේ වැඩසටහන් නිවේදිකා හා නිෂ්පාදිකා වාසනා ලක්මාලි මෙනවිය, පිරිස් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ නිවේදන ශිල්පීන් දෙදෙනා, යුද්ධ හමුදා පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන සංඥා නිලධාරි කාර්යාලයේ උපදේශකයින්ගේ සම්පත් දායකත්වය හිමිවූහ.



එම වැඩමුළුවේ සහතික පත් ප්‍රදානෝත්සවය ඉකුත් අගෝස්තු 21 වන දින යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී, පිරිස් පරිපාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේජියු කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේදී පවත්වනු ලැබූහ.





# ජාත්‍යන්තර කෙළිබිම රතින් සැරසූ

# සව්බල හා පහර






ලන්ඩන් නුවර පැවැති 1 වන WUMF ලෝක ටයිකොන්ඩෝ ශූරතාවලිය - 2023 සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ මේජර් ආර්බීඑන් රත්නායක අවුරුදු 40 ට වැඩි වයස් කාණ්ඩයේ කේවල, යුගල සහ කණ්ඩායම් ඉසව්වලින් රන් පදක්කම් තුනක් දිනාගැනීමට සමත්විය.

මෙම ශූරතා තරගාවලිය ඉකුත් ජූලි මස 21 වන දින සිට ජූලි 23 වන දින දක්වා A-2 Arena Crawley ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවති අතර, ඒ සඳහා රටවල් 17 ක් නියෝජනය කරමින් ක්‍රීඩක, ක්‍රීඩිකාවෝ 600 කට ආසන්න පිරිසක් සහභාගී වූහ. එහිදී එම සියලු රටවල් අභිබවා ඔහු කීර්තිමත් ටයිකොන්ඩෝ ක්‍රීඩක/මාස්ටර් සම්මානය දිනාගැනීම ටයිකොන්ඩෝ ඉතිහාසයේ ප්‍රථමවරට ශ්‍රී ලාංකිකයකු ලද සුවිශේෂී සම්මානය වේ.

මේජර් ආර්බීඑන් රත්නායක යනු ඇත්දැකීම් සම්භාරයක් සහිත ජාත්‍යන්තර මට්ටමේ ටයිකොන්ඩෝ ක්‍රීඩකයකු වන අතර, හෙතෙම කළුපටි 06 වෙනි ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ පුහුණුකරුවකු ද වේ. 2022 වසරේ සිට 2026 දක්වා ජාත්‍යන්තර හමුදා ක්‍රීඩා කවුන්සිලයේ (CISM) ලෝක හමුදා ටයිකොන්ඩෝ කමිටුවේ වත්මන් සභාපතිවරයාද වන හෙතෙම මෙවන් කීර්තිමත් ජාත්‍යන්තර පත්වීමක් සඳහා තෝරාගත් පළමු යුද්ධ හමුදා නිලධාරියා ලෙසද ඉතිහාසයට එක්වේ. මෙවර රණවිරුවා පසුකවරය ඔහුගේ රුවෙන් සරසනුයේ ජාත්‍යන්තර කෙළිබිමෙහි විරු හරඹ පෑ එම අභීත රණවිරුවාට උපහාර පිණිසමය.